# සිව්වැනි කොටස

## සිව්වැනි කොටස

### මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩකටයුතු හා මෙහෙයුම් වලට අදාළ 1999 ප්‍රධාන නීති අණපනත්


| | | පිටුව |
|---|---|---|
| 1. | 1999 අංක 6 දරන බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් (සංශෝධන) පනත | I |
| 2. | 1999 අංක 8 දරන දුම්කොළ බදු පනත | II |
| 3. | 1999 අංක 20 දරන කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනත | X |
| 4. | 1999 අංක 21 දරන ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත | XVIII |
| 5. | 1999 අංක 22 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකුව (සංශෝධන) පනත | XXI |
| 6. | 1999 අංක 24 දරන මුදල් (සංශෝධන) පනත | XXIV |
| 7. | 1999 අංක 25 දරන මුද්දර ගාස්තු (සංශෝධන) පනත | XXVII |
| 8. | 1999 අංක 29 දරන ණය සහනදායක (සංශෝධන) පනත | XXVIII |
| 9. | 1999 අංක 30 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත | XXX |
| 10. | 1999 අංක 34 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (සංශෝධන) පනත | XXXVII |
| 11. | 1999 අංක 41 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත | XXXVIII |
| 12. | 1999 අංක 49 දරන විසර්ජන (සංශෝධන) පනත | XLIII |

# 1999 අංක 6 දරන බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1999 මාර්තු මස 26 වන දින.]

**බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකාව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සාමාජිකයකු වන හෙයින් ද, ශ්‍රී ලංකාවට ඒ අරමුදලේ සාමාජිකයකු වීමට හැකි කරනු ලැබූ බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් පනත සම්මත කිරීමට පෙරාතුව ඒ අරමුදලේ මුල් ගිවිසුම් කොන්දේසි පාඨය පාර්ලිමේන්තුව ඉදිරියෙහි තබනු ලැබූ හෙයින් ද :

අරමුදලේ පාලක මණ්ඩලය විසින් 1997 සැප්තැම්බර් මස හොංකොංහි දී පවත්වන ලද වාර්ෂික රැස්වීමේ දී, ඒ අරමුදලේ දනට සිටින හා නව සාමාජිකයන්ට එක් වතාවකට සීමා වූ විශේෂ ගැනුම් හිමිකම් වෙන්කර දීමක් සඳහා විධිවිධාන සලසන එකී මුල් ගිවිසුමේ සංශෝධනයක් (ඒ සංශෝධනය, මෙම පූර්විකාවෙහි මින් මතු "යෝජිත සංශෝධනය" යනුවෙන් සඳහන් කරනු ලැබේ) අනුමත කරන ලද හෙයින් ද :

යෝජිත සංශෝධනයේ පාඨය, 1998 අගෝස්තු මස 4 වන දින දී පාර්ලිමේන්තුව ඉදිරියෙහි තබන ලද හෙයින් ද :

එකී එක් වතාවකට සීමා වූ විශේෂ ගැනුම් හිමිකම් වෙන්කර දීමේ අයිතිවාසිකම්වල ප්‍රතිලාභය ලබා ගැනීමට ශ්‍රී ලංකාවට හැකිවන පරිදි එම යෝජිත සංශෝධනය පිළිගැනීමට, ආණ්ඩුව තීරණය කර ඇති හෙයින් ද :

ඒ තීරණයට පූර්ණ බලය ලබාදීම හා ඒ තීරණය බලගැන්වීම පිණිස බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් පනත සංශෝධනය කිරීම අවශ්‍ය වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත, 1999 අංක 6 දරන බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධයෙන් වූ ගිවිසුම් කොන්දේසිවලට කරන ලද හතරවන සංශෝධනය ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් ක්‍රියාත්මක වන දිනය වශයෙන්, ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් සහතික කරනු ලබන යම් දිනයක සිට ක්‍රියාත්මක වන්නේය.

2. බ්‍රෙට්න් වුඩ්ස් ගිවිසුම් පනතේ, 10 වන වගන්තියේ, "අරමුදල් ගිවිසුම" යන්නෙහි අර්ථ කථනය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

'අරමුදල් ගිවිසුම' යන්නෙන් -

(අ) විශේෂ ගැනුම් හිමිකම් පදනම් කරගනු ලැබූ පහසුකමක් ඇති කරලීම පිණිස (එකී සංශෝධනයේ පාඨය 1968 නොවැම්බර් මස 23 වන දින නියෝජිත මන්ත්‍රී මණ්ඩලය ඉදිරියෙහි තබන ලදී.) ; සහ

(ආ) නව ජාත්‍යන්තර මූල්‍ය ක්‍රමයක් සංස්ථාපනය කිරීම පිණිස, (එකී සංශෝධනය 1978 අප්‍රේල් මස 4 වන දින ජාතික රාජ්‍ය සභාව ඉදිරියෙහි තබනු ලැබූ අරමුදලේ ගිවිසුම් කොන්දේසිවල පාඨයෙහි ඇතුළත් කරන ලදී.) ; සහ

(ඇ) ඒ ව්‍යවස්ථා යටතේ වූ ස්වකීය බැඳීම් ඉටු නොකරන සාමාජික රටක ඡන්දය දීමේ හා ඊට සම්බන්ධ අයිතිවාසිකම් අත්හිටුවීම සඳහා විධිවිධාන සැලසීම පිණිස (එකී සංශෝධනයේ පාඨය 1991 ඔක්තෝබර් මස 11 වන දින පාර්ලිමේන්තුව ඉදිරියෙහි තබන ලදී.) ; සහ

(ඈ) අරමුදලේ දනට සිටින හා නව සාමාජිකයන්ට එක් වතාවකට සීමා වූ විශේෂ ගැනුම් හිමිකම් වෙන්කර දීමක් සඳහා විධිවිධාන සැලසීම පිණිස (එකී සංශෝධනයේ පාඨය 1998 අගෝස්තු මස 4 වන දින දී පාර්ලිමේන්තුව ඉදිරියෙහි තබන ලදී.)

මුලින් සම්මත කොට ඉන් අනතුරුව සංශෝධනය කරන ලද පරිදි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගිවිසුම් කොන්දේසි අදහස් වේ.

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

# 1999 අංක 8 දරන දුම්කොළ බදු පනත

[ සහතිකය සටහන් කළේ 1999 අප්‍රේල් මස 09 වන දින.]

**ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක සහ පයිප්ප දුම්කොළ සඳහා බද්දක් පැනවීම පිණිස ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 1999 අංක 8 දරන දුම්කොළ බදු පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරනු ලබන සෑම සිගරැට්ටුවක් ම, සුරුට්ටුවක් ම, බීඩියක් ම, සිගරැට් ආදේශකයක්ම සඳහා සහ සෑම පයිප්ප දුම්කොළ කිලෝග්‍රෑමයක් ම සඳහා, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන ඒ ඒ අනුප්‍රමාණ අනුව වූ (මෙහි මින් මතු "දුම්කොළ බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) බද්දක් පනවා අය කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් පනවනු ලබන දුම්කොළ බදු අනුප්‍රමාණය හෝ අනුප්‍රමාණ, ඒ භාණ්ඩයේ පන්තිය හෝ විස්තරය අනුව නිශ්චය කරනු ලැබිය හැකි අතර, ඒ අනුව, ඒ භාණ්ඩයේ විවිධ පන්තිවලට හෝ විස්තරවලට අනුව වෙනස් වූ දුම්කොළ බදු අනුප්‍රමාණ නිශ්චය කරනු ලැබිය හැකි ය.

(3) පිළිවෙලින් සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක සහ පයිප්ප දුම්කොළ හෝ ඒවායේ යම් පන්තියකට හෝ විස්තරයකට අයත් භාණ්ඩ සඳහා අය කරනු ලැබිය යුතු දුම්කොළ බද්ද, මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, කලින් කල වෙනස් කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය හෝ යටතේ කරනු ලැබූ සෑම නියමයක් ම, එය ගැසට් පත්‍රයේ පළ කරන ලද දින සිට හෝ ඒ නියමයෙහි සඳහන් යම් පසු දිනයක සිට බලාත්මක විය යුතු අතර, ඒ නියමය අනුමත කිරීම සඳහා හැකි තාක් පහසු ඉක්මණින් එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය හෝ (3) වන උපවගන්තිය හෝ යටතේ වූ යම් නියමයක් අනුමත කිරීම පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරනු ලැබූ අවස්ථාවක දී එසේ අනුමතය ප්‍රතික්ෂේප කරන ලද දින සිට ඒ නියමය පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු ය. එහෙත් ඒ යටතේ එවකට සිදු කර තිබුණු යම් දෙයක වලංගු භාවයට ඉන් හානියක් සිදු නොවිය යුතු ය. ඒ නියමය අනුමත කිරීම ප්‍රතික්ෂේප කරන ලද්දේ යයි සලකනු ලබන දිනය පිළිබඳ නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

(6) යම් කර්මාන්ත ශාලාවකින් ඉවතට ගෙන යනු ලබන සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක සහ පයිප්ප දුම්කොළ, ඒ කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කරන ලද සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක සහ පයිප්ප දුම්කොළ වන ලෙස, මේ පනතේ කාර්ය සඳහා, සලකනු ලැබිය යුතු ය.

3. (1) සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ නිෂ්පාදකයකු වශයෙන් ව්‍යාපාරය කර ගෙන යන එක් එක් තැනැත්තා විසින් දුම්කොළ බද්ද ගෙවනු ලැබිය යුතු ය. ඒ කර්මාන්ත ශාලාවේ නිෂ්පාදනය කරනු ලබන්නා වූ සහ ඒ කර්මාන්ත ශාලාවෙන් ඉවතට ගෙන යන්නා වූ සිගරැට්, සුරුට්ටු, බීඩි සහ සිගරැට් ආදේශක සංඛ්‍යාවට සහ පයිප්ප දුම්කොළ කිලෝග්‍රෑම් ප්‍රමාණයට අනුකූලව බදු ප්‍රමාණය නිශ්චය කරනු ලැබිය යුතු අතර, එවැනි කර්මාන්ත ශාලාවකින් යම් සතියක දී ඉවතට ගෙන යනු ලබන මුළු සිගරැට්, සුරුට්ටු, බීඩි සහ සිගරැට් ආදේශක සංඛ්‍යාව සහ පයිප්ප දුම්කොළ කිලෝග්‍රෑම් ප්‍රමාණය මත ගෙවිය යුතු බදු මුදලේ ප්‍රමාණය, මේ පනතින් විධිවිධාන සලස්වා ඇති පරිදි, ඊළඟ සතියේ අවසානයට පෙර ගෙවනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ විධිවිධානවලට යටත්ව, යම් තැනැත්තකු විසින්, යම් කර්මාන්ත ශාලාවක නිෂ්පාදනය කරනු ලබන සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ සම්බන්ධයෙන් ගෙවනු ලැබිය යුතු දුම්කොළ බද්ද මේ පනතේ විධිවිධානවලට අනුකූලව යථා පරිදි ගෙවනු ලැබුවහොත් සහ ගෙවනු ලබන තෙක්, ඒ කර්මාන්ත ශාලාවෙන් සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ කිසිවක් පිටතට ගෙන යාමට සැලැස්වීම හෝ ඉඩ දීම ඒ තැනැත්තා විසින් නොකළ යුතු ය.

(3) යම් දුම්කොළ ප්‍රමාණයක් යම් කර්මාන්ත ශාලාවක් වෙත ගෙන ගොස් භාර දුන් විටක හෝ සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ යම් ප්‍රමාණයක් යම් කර්මාන්ත ශාලාවකින් ඉවත ගෙන යාමට ඇති විටක,

අවස්ථාවෝචිත පරිදි, එසේ ගෙනවුත් භාර දෙන ලද දුම්කොළ ප්‍රමාණය හෝ එසේ ඉවත ගෙන යාමට යෝජිත සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ ප්‍රමාණය හෝ නිශ්චිතව සඳහන් කොට තමා විසින් අත්සන් කරන ලද ප්‍රකාශයක්, අවස්ථාවෝචිත පරිදි, එසේ ඒ දුම්කොළ ප්‍රමාණය ගෙනවුත් භාර දෙන ලද වේලාවෙන් පසු පැය හතලිස් අටක් තුළ දී සහ එසේ එකී භාණ්ඩ ඉවත ගෙන යාමට පැය හතලිස් අටකට කලින්, සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ තත් කාර්යය සඳහා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් නම් කරනු ලැබූ යම් නිලධරයකුට හෝ සැපයීම, ඒ කර්මාන්ත ශාලාව භාරව සිටින තැනැත්තාගේ යුතුකම වන්නේ ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් සෑම ප්‍රකාශයක් ම සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරන ලද හෝ සපයන ලද ආකෘතියක ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

4. (1) මේ පනතේ කාර්ය සඳහා, ලියාපදිංචි වූ නිෂ්පාදකයකු විසින්, තමා නිෂ්පාදනය කළ සහ අපනයනය කිරීමට තමා අදහස් කරන සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ ප්‍රමාණය ද, ඒවා අපනයනය කිරීමට තමා අදහස් කරන රට ද, නිශ්චිතව සඳහන් කරමින් ප්‍රකාශයක් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබූ විටක, ඒ සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ ගබඩා කොට ඇති යම් කර්මාන්ත ශාලාවකින් හෝ ගබඩාවකින් මේ පනත යටතේ ගෙවිය යුතු දුම්කොළ බද්ද ගෙවීමෙන් තොරව, ඒවා ඉවත් කර ගෙන යාමට සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ නිෂ්පාදකයාට ඉඩ දිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ප්‍රකාශයක් කරන සෑම නිෂ්පාදකයකු විසින් ම, ඒ ප්‍රකාශයේ සඳහන් සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ ප්‍රමාණය ඒ ප්‍රකාශයේ සඳහන් රටට අපනයනය කළ බවට, සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා සෑහීමකට පත් වන පරිදි සාක්ෂි, ඒ ප්‍රකාශය කොට මාස හයක් තුළ දී ඉදිරිපත් කළ යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් නිෂ්පාදකයකු විසින් ඒ උපවගන්තිය යටතේ කරන ලද ප්‍රකාශයෙහි සඳහන් සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ ප්‍රමාණය ඒ ප්‍රකාශයෙහි සඳහන් රටට අපනයනය කරන ලද බවට සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි සාක්ෂි ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ ප්‍රමාණය විෂයයෙහි ගෙවිය යුතු දුම්කොළ බද්ද, ඒ සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ ප්‍රමාණය ගබඩා කොට තිබුණු යම් කර්මාන්ත ශාලාවකින් හෝ ගබඩාවකින් හෝ ඉවත් කර ගෙන ගිය දින සිට ඒ බද්ද ගෙවිය යුතු වන දිනය දක්වා කාලයට ඒ බද්ද වර්ෂයකට සියයට දහය බැගින් වූ පොලියක් ද සමග ගෙවන ලෙස, ඒ නිෂ්පාදකයාට නියම කරනු ලැබිය යුතු ය.

5. (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව, යම් තැනැත්තකු මේ පනතේ කාර්ය සඳහා නිෂ්පාදකයකු ලෙස සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියාපදිංචි කර ඇත්නම් මිස, සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ නිෂ්පාදනය කිරීම සඳහා දුම්කොළ කිසිවක් ඒ තැනැත්තා විසින් භාවිත නොකළ යුතු ය.

(2) මේ පනතේ කාර්ය සඳහා නිෂ්පාදකයකු ලෙස ලියාපදිංචි වීම සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම :–

(අ) තත් කාර්ය සඳහා සපයනු ලබන ආකෘතියක සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය ;

(ආ) සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ නිෂ්පාදනය කිරීම සඳහා දුම්කොළ භාවිත කිරීම හෝ යෝජිත භාවිත කිරීම සම්බන්ධයෙන් ඒ ආකෘති පත්‍රයේ දක්වා ඇති සියලු විස්තර ඇතුළත් කරන ලද්දක් විය යුතු ය ; තව ද

(ඇ) නියමිත ඉල්ලුම් පත්‍ර ගාස්තුව, ඉල්ලුම් පත්‍රය සමග ඉදිරිපත් කළ යුතු ය.

(3) නිශ්චිත දුම්කොළ ප්‍රමාණයක් භාවිත කොට, අවස්ථාවෝචිත පරිදි, නිෂ්පාදනය කරනු ලබන හෝ නිෂ්පාදනය කිරීමට ඇස්තමේන්තු කරනු ලබන සිගරැට්, සුරුට්ටු, බීඩි සහ සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ ප්‍රමාණය පිළිබඳ විස්තර ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස, මේ පනතේ කාර්ය සඳහා නිෂ්පාදකයකු වශයෙන් ලියාපදිංචි කර ඇති තැනැත්තකුට සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන කවර වුවද අවස්ථාවක දී එවැනි වාර්තාවක් ඒ තැනැත්තා විසින් සැපයිය යුතු අතර, ඒ නිෂ්පාදකයා විසින් නිෂ්පාදනය කරනු ලබන සිගරැට්, සුරුට්ටු, බීඩි සහ සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ පන්තිය හෝ ඒවායේ විස්තර හෝ සම්බන්ධයෙන් වෙනම විස්තර ඒ වාර්තාවෙන් සැපයිය යුතු ය.

6. (1) යම් නිෂ්පාදකයකු විසින් මේ පනත යටතේ කලින් කල ගෙවිය යුතු දුම්කොළ බද්ද සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට හෝ ඒ කොමසාරිස් ජනරාල්වරයා විසින් නම් කරනු ලබන තැනැත්තකුට ගෙවිය යුතු අතර, කොමසාරිස් ජනරාල්වරයා හෝ ඒ තැනැත්තා හෝ විසින් ඒ මුදල ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) දුම්කොළ බද්ද ගෙවිය යුතු ආකාරය පිළිබඳ විධිවිධාන 21 වන වගන්තිය යටතේ සාදනු ලැබූ නියෝග මගින් සලස්වනු ලැබිය හැකි ය.

7. (1) මේ පනත යටතේ යම් වරදක් සිදු කර ඇත්තේ ද නැතහොත් සිදු කරමින් පවතී ද යන්න නිශ්චය කර දන ගැනීම සඳහා හෝ යම් වාහනයක, යාත්‍රාවක, කර්මාන්ත ශාලාවක හෝ පරිශ්‍රයක දුම්කොළ, සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ කොපමණ ප්‍රමාණයක් තිබේ ද යන්න නිශ්චය කර දන ගැනීම සඳහා හෝ ඒවා සම්බන්ධයෙන් දුම්කොළ බද්ද, සුරාබදු (විශේෂ විධිවිධාන) තීරු බදු හෝ වෙනත් යම් බද්දක් ගෙවා තිබේ ද හෝ ගෙවනු ලැබිය යුතු ද යන්න නිශ්චය කර දන ගැනීම සඳහා හෝ මේ පනත යටතේ සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත සපයා ඇති යම් වාර්තාවක හෝ ප්‍රකාශයක සත්‍යතාව සනාථ කර ගැනීම සඳහා හෝ, අවස්ථාවෝචිත පරිදි, දුම්කොළ, සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ යනාදියට අදළ පොත් හෝ ලේඛන කිසිවක් පරීක්ෂා කිරීම සඳහා, සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ සුරාබදු දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයකුගේ නිලයට වඩා පහළ නොවූ නිලයක් දරන නිලධරයකු විසින් හෝ තීරුබදු ගෙවා ඇද්ද නැතහොත් ගෙවීමට ඇද්ද යන්න නිශ්චය කොට දන ගැනීම සඳහා රේගු දෙපාර්තමේන්තුවේ අධිකාරිවරයකුගේ නිලයට වඩා පහළ නොවූ නිලයක් දරන නිලධරයකු විසින් හෝ උප පොලිස් පරීක්ෂකවරයකුගේ නිලයට වඩා පහළ නොවූ නිලයක් දරන පොලිස් නිලධරයකු විසින්, -

(අ) දුම්කොළ, සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ කිසිවක් ප්‍රවාහනය කරන හෝ ප්‍රවාහනය කරන්නේ යයි සැක කරනු ලබන යම් වාහනයක් හෝ යාත්‍රාවක් නවතා ඒ තුළට ඇතුළු විය හැකි ය ;

(ආ) දුම්කොළ, සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ කිසිවක් තබා ඇති හෝ ගබඩා කර ඇති හෝ තබා ඇති බවට හෝ ගබඩා කොට ඇති බවට සැක කරනු ලබන යම් කර්මාන්ත ශාලාවකට හෝ පරිශ්‍රයකට කවරවුවද සාධාරණ වේලාවක දී ඇතුළු වී එය පරීක්ෂා කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් නිලධරයකු එකී උපවගන්තිය යටතේ වූ බලතල ක්‍රියාත්මක කිරීමේ දී ඔහුට විරෝධය පාන හෝ අවහිර කරන සෑම තැනැත්තකු ම මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

8. (1) දුම්කොළ, සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ යම් ප්‍රමාණයක් ශ්‍රී ලංකාවට ආනයනය කිරීමට අදළ පිවිසුම් බිල්පත්‍රයේ අනුපිටපත තමා සන්තකයේ ඇත්නම් මිස, මේ පනතේ කාර්ය සඳහා නිෂ්පාදකයකු වශයෙන් ලියාපදිංචි වී ඇති තැනැත්තකු විසින්, ආනයනය කළ දුම්කොළ, සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ කිසිදු ප්‍රමාණයක් තම කර්මාන්ත ශාලාවේ තබා නොගත යුතු ය.

(2) මේ පනතේ කාර්ය සඳහා නිෂ්පාදකයකු වශයෙන් ලියාපදිංචි වී ඇති යම් තැනැත්තකුගෙන්, සුරාබදු දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයකුගේ නිලයට වඩා පහළ නොවූ නිලයක් දරන නිලධරයකු විසින් හෝ උප පොලිස් පරීක්ෂකවරයකුගේ නිලයට වඩා පහළ නොවූ නිලයක් දරන පොලිස් නිලධරයකු විසින් හෝ ඉල්ලා සිටි විටක, අවස්ථාවෝචිත පරිදි, තම කර්මාන්ත ශාලාවේ තබා තිබෙන ආනයනය කළ දුම්කොළ, සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළවලට අදළ පිවිසුම් බිල්පත්‍රයේ අනු පිටපත ඒ නිලධරයා විසින් පරීක්ෂා කර බලනු සඳහා ඔහු වෙත ඉදිරිපත් කළ යුතු ය.

9. මේ පනතේ කාර්ය සඳහා නිෂ්පාදකයකු වශයෙන් ලියාපදිංචි වී ඇති සෑම තැනැත්තකු විසින් ම, දුම්කොළ ප්‍රමාණයන් කිරා බැලීමේ කාර්යය සඳහා කිරුම් හා මිනුම්වලට අදළ තත් කාලයේ බලපවත්නා යම් නීතියක් යටතේ ස්ථාපනය කරනලද ප්‍රමිතිවලට අනුකූල තරාදි පඩි සහ මිනුම් උපකරණ ඒ නීතියේ විධිවිධානවලට අනුකූලව මුද්‍රා තැබීමට සලස්වා තම කර්මාන්ත ශාලාවේ තබා ගත යුතු අතර, සුරාබදු දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරයකුගේ නිලයට වඩා පහළ නොවූ නිලයක් දරන නිලධරයකු විසින් හෝ උප පොලිස් පරීක්ෂකවරයකුගේ නිලයට වඩා පහළ නොවූ නිලයක් දරන පොලිස් නිලධරයකු විසින් හෝ ඉල්ලා සිටි විටක, තම කර්මාන්ත ශාලාවේ ඇති දුම්කොළ යම් ප්‍රමාණයක් කිරා පෙන්වීම හෝ කිරා පෙන්වීමට සැලැස්වීම හෝ කරනු ලැබිය යුතු ය.

10. (1) සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා නොවන සුරා බදු දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් මේ පනතේ විධිවිධාන යටතේ හෝ ඒ විධිවිධාන යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ හෝ කරනු ලැබූ යම් තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, තමා වෙත ඒ තීරණය දනුම් දෙනු ලැබීමෙන් පසු දින තිහක් තුළ දී ඒ තීරණයට විරුද්ධව අභියාචනයක් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) මේ පනතේ විධිවිධාන යටතේ හෝ ඒ විධිවිධාන යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ හෝ සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් ගනු ලැබූ යම් තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, තමා වෙත ඒ තීරණය දනුම් දෙනු ලැබීමෙන් පසු දින තිහක් තුළ දී, ඒ තීරණයට විරුද්ධව අභියාචනයක් මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ වූ සෑම අභියාචනයක් ම ලිඛිතව විය යුතු අතර, ඒ අභියාචනයට හේතු වූ කරුණු එහි සඳහන් කර තිබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් තීරණය කිරීමට පෙර, අභියාචක විසින් ම හෝ ඔහුගේ බලයලත් නියෝජිතයා විසින් හෝ කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් අභියාචකට දෙනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ හෝ (2) වන උපවගන්තිය යටතේ හෝ, අවස්ථාවෝචිත පරිදි, සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත හෝ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත හෝ අභියාචනයක් ඉදිරිපත් කර ඇත්තේ යම් තීරණයකට විරුද්ධව ද ඒ තීරණය ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ නිෂ්ප්‍රභ කිරීම සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් හෝ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ විසින් කරනු ලැබිය හැකි ය.

11. ආනයනය කළ විට තීරු බදු හෝ සුරාබදු ගෙවිය යුතු –

(අ) රේගු ආඥාපනතින් සහ 1989 අංක 13 දරන සුරාබදු (විශේෂ විධිවිධාන) පනතින් හෝ ඒවා යටතේ හෝ සලස්වා ඇති විධිවිධාන පරිදි හැර, එකී බදු නොගෙවා ශ්‍රී ලංකාවේ යම් වරායකට හෝ වෙනත් ස්ථානයක නැවෙන් ගොඩබාන ලද හෝ ගෙන එන ලද හෝ යම් ගුවන් යානයකින් ශ්‍රී ලංකාවේ යම් ගුවන් තොටුපළක දී ගොඩ බාන ලද ; හෝ

(ආ) වෙනත් විස්තරයක භාණ්ඩ බහාලූ කන්ටේනරයක් තුළ සඟවා ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද ; හෝ

(ඇ) ශ්‍රී ලංකාවට ගෙනවුත් භාර දීමට පෙර හෝ භාර දුන් පසු හෝ එම සිගරට්වලට අදාළ පිවිසුම් බිල් පත්‍රයෙහි ඇති සටහනට අනුරූප නොවන බව සොයා දැන ගත්තා වූ ; හෝ

(ඈ) රේගු දෙපාර්තමේන්තුවේ හෝ සුරාබදු දෙපාර්තමේන්තුවේ නිලධරයකු රැවටීමට අදහස් කරන ලද බව පෙනී යන ආකාරයට සඟවා තිබුණු හෝ අසුරා තිබුණු

සිගරට් කිසිවක් ගබඩා කරන, ප්‍රවාහනය කරන, සපයන, සන්තකයේ තබාගෙන සිටින, විකුණන හෝ අන්‍යාකාරයකින් ඒවා සම්බන්ධයෙන් කටයුතු කරන සෑම තැනැත්තෙක් ම මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

12. දුම්කොළ බද්ද හෝ තීරු බද්ද හෝ සුරා බද්ද නොගෙවා සිගරට්, සුරුට්ටු, බීඩි, සිගරට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ ප්‍රවාහනය කරන, සපයන, විකුණන, ගබඩා කරන හෝ විකිණීමට තබන සෑම තැනැත්තෙක් ම මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය. -

13. සිගරට්, සුරුට්ටු, බීඩි, සිගරට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ නිෂ්පාදකයකු හෝ වෙළෙන්දකු හෝ ආනයනය කරන්නකු හෝ ඒ පිළිබඳව කටයුතු කරන්නකු හෝ වන්නා වූ යම් තැනැත්තකුට 1979 අංක 1 දරන පාරිභෝගිකයන් ආරක්ෂා කිරීමේ පනත යටතේ නිකුත් කරන ලද යම් විධානයක් අනුව කටයුතු කිරීම ඒ තැනැත්තා විසින් පැහැර හරිනු ලැබුවහොත් හෝ නොසලකා හරිනු ලැබුවහොත් ඒ තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

14. මේ පනතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක හෝ විධිවිධාන උල්ලංඝනය කරන හෝ ඒ අනුව කටයුතු කිරීම පැහැර හරින යම් තැනැත්තෙක් මේ පනත යටතේ වරදකට වරදකරු වන්නේ ය.

15. (1) මේ පනත යටතේ වරදකට වරදකරු වන සෑම තැනැත්තකු ම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් දශ ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු පහකට නොවැඩි කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ ඒ තැනැත්තා යටතේ වන්නේ ය.

(2) සිගරට්, සුරුට්ටු, බීඩි, සිගරට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ කිසිවක් සම්බන්ධයෙන් මේ පනත යටතේ වූ යම් වරදක් සිදු කළ යම් තැනැත්තකු වරදකරු කරන අධිකරණය විසින් නියම කරනු ලබන වෙනත් යම් දණ්ඩනයකට අමතරව, ඒ සිගරට්, සුරුට්ටු, බීඩි, සිගරට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ ප්‍රමාණය ද, ඒ වරද සිදු කිරීමෙහි ලා හෝ ඒ වරද සිදු කිරීම සම්බන්ධයෙන් හෝ භාවිත කරන ලද යම් වාහනයක් හෝ භාණ්ඩයක් ද රාජ සන්තක කළ යුතු බවට ආඥාවක් ඒ අධිකරණය විසින් කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කරනු ලැබූ ආඥාවක්, –

(අ) එකී රාජ සන්තක කිරීමට විරුද්ධව අභියාචනයක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයක් වෙත ඉදිරිපත් කර තිබී, එකී රාජ සන්තක කිරීමේ ආඥාව ස්ථිර කරමින් හෝ පිළිගනිමින් හෝ ඒ අභියාචනය අවසාන වශයෙන් තීරණය කරනු ලැබූ විට

(ආ) ඒ රාජ සන්තක කිරීමට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා ඉඩ දී ඇති කාල පරිච්ඡේදය තුළ දී එවැනි අභියාචනයක්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයක් වෙත ඉදිරිපත් කර නොමැති අවස්ථාවක දී ඒ කාලපරිච්ඡේදය ඉකුත්වීමෙන් පසුව

බලාත්මක වන්නේ ය.

(4) මේ පනත යටතේ වූ වරදක් සඳහා වරදකරු කරනු ලැබූ තැනැත්තකු මේ පනතේ කාර්ය සඳහා ලියාපදිංචි වී ඇති නිෂ්පාදකයකු වන අවස්ථාවක දී, මෙහි මින් ඉහත විධිවිධාන සලස්වා ඇති වෙනත් යම් දණ්ඩනයකට අමතරව, නිෂ්පාදකයකු වශයෙන් ඒ තැනැත්තාගේ ලියාපදිංචිය අවලංගු කරමින් ආඥාවක් ඒ අධිකරණය විසින් කරනු ලැබිය හැකි ය;

එසේ වුවද, එවැනි යම් තැනැත්තකු නිෂ්පාදකයකු වශයෙන් නැවත ලියා පදිංචි කිරීම සුදුසු යයි සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා අදහස් කරන්නේ නම්, ඔහු විසින් ඒ තැනැත්තා නිෂ්පාදකයකු වශයෙන් නැවත ලියාපදිංචි කරනු ලැබිය හැකිය.

(5) මේ පනත යටතේ වූ යම් වරදක් යම් සංස්ථාවක් විසින් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී, ඒ වරද සිදු කරන ලද්දේ තමාගේ අනුදැනුම ඇතිව නොවන බවත් ඒ වරද සිදු කිරීම වැළැක්වීම සඳහා අවශ්‍ය උද්යෝගයෙන් තමා ක්‍රියා කළ බවත් ඔප්පු කරන්නේ නම් මිස, ඒ වරද සිදු කළ අවස්ථාවේ දී ඒ සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු වූ, සාමාන්‍යාධිකාරීව, ලේකම් හෝ එවැනි වෙනත් නිලධරයකුව සිටි සෑම තැනැත්තෙක් ම ඒ වරදට වරදකරුවෙක් වන ලෙස සලකනු ලැබිය යුතු ය.

(6) මේ පනත යටතේ වූ යම් වරදක් සුරාබදු කොමසාරිස්වරයකුගේ නිලයට වඩා පහළ නොවූ නිලයක් දරන සුරාබදු දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින්, අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ සහ සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ ලිඛිත අනුමැතිය ඇතිව, ඒ වරද සඳහා පනවනු ලැබිය හැකි උපරිම දඩයෙන් පහෙන් පංගුවකට සමාන මුදලක් අය කොට සමථයට පත් කරනු ලැබිය හැකි ය.

(7) (2) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවක් මගින් රාජ සන්තක කරන ලද දුම්කොළ, සිගරැට්, සුරුට්ටු, බීඩි සහ සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ කිසිවක් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් සිය සන්තකයට ගනු ලැබිය යුතු අතර, ඒවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා ඉන් උපලබ්ධ වන මුදල 17 වන වගන්තියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට බැහැර කරනු ලැබිය යුතු ය.

16. (1) තීරු බදු හෝ සුරාබදු නොගෙවූ දුම්කොළ, සිගරැට්, සුරුට්ටු, බීඩි සහ සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ කිසිවක්, ශ්‍රී ලංකා දුම්කොළ හෝ ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සිගරැට්, සුරුට්ටු, බීඩි සහ සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ නොවන බව ඔප්පු කරනු ලබන තෙක් ඒවා ශ්‍රී ලංකා දුම්කොළ හෝ ශ්‍රී ලංකාවේ නිෂ්පාදිත සිගරැට්, සුරුට්ටු, බීඩි සහ සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ ලෙස මේ පනතේ කාර්ය සඳහා පූර්ව නිගමනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ පවරනු ලැබූ යම් නඩුවක දී, යම් ද්‍රව්‍යයක් හෝ භාණ්ඩයක් දුම්කොළ වේ ද නැතහොත් ඒ ද්‍රව්‍ය හෝ භාණ්ඩය සිගරැට්ටුවක් ද, සුරුට්ටුවක් ද, බීඩියක් ද, සිගරැට් ආදේශකයක් ද නැතහොත් පයිප්ප දුම්කොළ ද යන්න පිළිබඳව ප්‍රශ්නයක් මතු වූ අවස්ථාවක දී, තම සහතිකයේ විස්තර කොට ඇති ද්‍රව්‍ය හෝ භාණ්ඩය, අවස්ථාවෝචිත පරිදි, දුම්කොළ, සිගරැට්, සුරුට්ටු, බීඩි සහ සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ බවට රජයේ රස පරීක්ෂකවරයා හෝ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දුම්කොළ නිලධරයකු හෝ සෑහෙන පළපුරුද්දක් ඇති සුරාබදු නිලධරයකු හෝ විසින් තම අත්සන යටතේ දෙන ලද සහතිකයක් සාක්ෂි වශයෙන් පිළිගනු ලැබිය යුතු අතර, එය, එහි සඳහන් කරුණු සම්බන්ධයෙන් බැලූ බැල්මට පිළිගනු ලැබිය යුතු සාක්ෂියක් වන්නේ ය.

17. (අ) 15 වන වගන්තියේ (6) වන උපවගන්තිය යටතේ ලබා ගන්නා සියලු මුදල් ; සහ

(ආ) 15 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ රාජ සන්තක කරන ලද භාණ්ඩ විකිණීමෙන් උප ලබ්ධ වන මුදල්

සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට ගෙවිය යුතු අතර, (දරන ලද යම් වියදමක් අඩු කර ගැනීමෙන් පසු) ඒ මුදල් පහත දැක්වෙන පරිදි යොදවනු ලැබිය යුතු ය :-

(i) ඉන් හතරෙන් තුන් පංගුවක් භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ගෙවිය යුතු අතර, ඔහු විසින් ඒ මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය ;

(ii) ඉතිරි මුදල, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යෝජනා ක්‍රමයක් අනුව මේ පනත බලාත්මක කිරීමට සහාය වන සුරාබදු නිලධරයන්, රේගු නිලධරයන්, පොලිස් නිලධරයන්, ඔත්තු සපයන්නන් සහ වෙනත් අය අතර බෙදා දීම සඳහා . මේ පනත යටතේ පිහිටුවන ලබන සහ සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ පාලනය යටතේ පවත්නා තැගි අරමුදලකට බැර කරනු ලැබිය යුතු ය.

18. මේ පනතේ කාර්ය සඳහා ලියාපදිංචි වූ යම් නිෂ්පාදකයකුට හෝ වෙනත් තැනැත්තකුට -

(අ) විශේෂ සේවයක් වශයෙන් අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන යම් සේවයක් ; හෝ

(ආ) තමාගේ නියමිත සේවා ස්ථානය නොවන යම් කර්මාන්ත ශාලාවකට හෝ ගබඩාවකට හෝ පරිශ්‍රයකට යම් සුරාබදු නිලධරයකුගේ පැමිණීම

අවශ්‍ය වන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, ඒ සේවය හෝ පැමිණීම හෝ වෙනුවෙන් ගෙවීම්, සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චය කරනු ලබන අනුප්‍රමාණ අනුව ඒ නිෂ්පාදකයා හෝ ඒ තැනැත්තා හෝ විසින් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවනු ලැබිය යුතු ය.

19. මේ පනතින් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා ඇති හෝ භාර කොට ඇති හෝ බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් මේ පනතේ විධිවිධාන කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා පැවරීම සුදුසු යයි සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාගේ මතය වන්නේ නම්, සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින්, ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හෝ සුරාබදු අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිඛිතව පවරනු ලැබිය හැකි ය.

20. මේ පනතේ යම් විධිවිධානයක් ප්‍රකාර, සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදයි සලකනු ලබන, යම් ක්‍රියාවක් හෝ බලය පැවරීමක් හෝ සම්බන්ධයෙන් සුරාබදු කොමසාරිස් ජනරාල්වරයාට, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට, සුරාබදු අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ යම් සුරාබදු නිලධරයකුට විරුද්ධව අලාභ ඉල්ලා කිසිදු නඩුවක් සිවිල් අධිකරණයක පවරනු නොලැබිය යුතු ය.

21. (1) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ සහ බලාත්මක කිරීමේ කාර්යය සඳහා සහ මේ පනතින් පනවනු ලැබූ දුම්කොළ බද්ද ගෙවීම මග හැරීම වැළැක්වීම සඳහා ද, නියම කළ යුතු යයි මේ පනතින් නියම කොට ඇති සියලු කාරණා සඳහා ද, මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) දුම්කොළ බද්ද ගෙවීමට යම් දුම්කොළ කිසිවක් භාවිත කරමින් දුම්කොළ බද්ද ගෙවීමට පෙර යම් කර්මාන්ත ශාලාවක නිෂ්පාදනය කරනු ලබන සිගරට්, සුරුට්ටු, බීඩි, සිගරට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ ගබඩා කිරීම සඳහා වෙනම ගබඩාවක් හෝ කාමරයක් ඒ කර්මාන්ත ශාලාවේ පවත්වා ගෙන යාම සඳහා ද, ඒ සිගරට්, සුරුට්ටු, බීඩි, සිගරට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ මත ගෙවිය යුතු දුම්කොළ බද්ද ගෙවීමට පෙර ඒ සිගරට්, සුරුට්ටු, බීඩි, සිගරට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ ඒ ගබඩාවෙන් හෝ කාමරයෙන් ඉවත ගෙන යාම අධීක්ෂණය කිරීම හෝ පාලනය කිරීම අරභයා සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා විසින් ගනුලැබිය හැකි පියවර සඳහා සහ අපනයනය කිරීමට අදහස් කරනු ලබන සිගරට්, සුරුට්ටු, බීඩි, සිගරට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ සම්බන්ධයෙන් 4 වන වගන්තිය යටතේ ප්‍රදානය කළ යුතු දුම්කොළ බදු සහනය සහ කොන්දේසිවලට යටත්ව ද, ඒ නියම සහ කොන්දේසි සඳහා ද විධිවිධාන, (1) වන උපවගන්තියෙන් පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, මේ උපවගන්තිය යටතේ සාදන ලද නියෝගවලින් සලස්වනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, ඒ පළ කිරීමේ දින සිට හෝ ඒ නියෝගයේ සඳහන් යම් පසු දිනයක සිට ඒ නියෝගය ක්‍රියාත්මක විය යුතු ය.

(4) සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකිතාක් ඉක්මණින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක් එහි අනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ සේ සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරනු ලැබූ කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(5) යම් නියෝගයක් පරිච්ඡින්න කරන ලදයි සලකනු ලබන්නේ යම් දිනයක සිට ද, ඒ දිනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

22. (1) (245 වන අධිකාරය වූ) 1953 අංක 27 දරන දුම්කොළ බදු පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) 1953 අංක 27 දරන දුම්කොළ බදු පනත ඉවත් කිරීම

නොතකා

(අ) ඒ පනත යටතේ සාදන ලද්ද වූ ද, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී බලාත්මකව පැවතියා වූ ද නියෝග, මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන තාක් දුරට, මේ පනත යටතේ සාදනු ලැබූ නියෝග ලෙස සලකනු ලැබිය යුතු අතර, මේ පනත යටතේ සාදනු ලබන නියෝගවලින් එකී නියෝග වෙනස් කරනු, සංශෝධනය කරනු හෝ පරිච්ඡින්න කරනු ලබන තෙක් ඒ නියෝග බලාත්මකව පැවතිය යුතු ය.

(ආ) එකී පනතේ කාර්ය සඳහා නිෂ්පාදකයන් වශයෙන් ලියාපදිංචි වී සිටින සියලු තැනැත්තන්, මේ පනතේ 5 වන වගන්තිය යටතේ ලියාපදිංචි වූ නිෂ්පාදකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

23\. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

24\. මේ පනතේ, –

"බීඩි" යන්නෙන්, බීඩි නිෂ්පාදනය සඳහා විශේෂයෙන් වවනු ලබන්නා වූ ද කපා, පොඩිකර, කැබලිකර හෝ කුඩු කර, –

(i) ඩයෝස්පයිරොස් මෙලනොක්සිලොන් හෝ ඩයොස්පයිරොස් එබිනම් යන උද්භිද විද්‍යාත්මක නාමයෙන් හඳුන්වනු ලබන එබනනි වර්ගයේ ඡර්ම කලාපීය ශාඛයෙන් හෝ එහි යම් ආදේශක ශාකයකින් ලබා ගන්නා කොළයක ඔතන ලද්ද වූ ; සහ

(ii) දුම්පානය සඳහා අදහස් කරන ලද්ද වූ

දුම්කොළ අදහස් වේ ;

"සුරුට්ටු" යන්නෙන්, කපා පොඩිකර, කැබලිකර හෝ කුඩුකර,–

(i) දුම්කොළයක ඔතන ලද ; සහ

(ii) දුම්පානය සඳහා අදහස් කරන ලද

දුම්කොළ අදහස් වේ ;

"සිගරට්" යන්නෙන්, සිගරට් නිෂ්පාදනය සඳහා විශේෂයෙන් වවනු ලබන්නා වූ ද කපා පොඩිකර, කැබලිකර හෝ කුඩුකර, –

(i) දුම්කොළ හෝ බීඩි නිෂ්පාදනය සඳහා අදහස් කළ කොළ වර්ගයක් හෝ නොවන යම් වර්ගයක දවටනයක ඔතන ලද්ද වූ ; සහ

(ii) දුම්පානය සඳහා අදහස් කරන ලද

දුම්කොළ අදහස් වේ ;

"සිගරට් ආදේශක" යන්නෙන්, කවර ආකාරයක වුව ද දවටනයක ඔතනු ලැබූ සහ දුම්පානය සඳහා අදහස් කරනු ලැබූ දුම්කොළ අදහස් වන අතර, බීඩි, සුරුට්ටු හෝ සිගරට් ඊට ඇතුළත් නොවේ ;

"සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා" යන්නෙන්, සුරාබදු ආඥාපනත යටතේ පත් කරන ලද සුරාබදු කොමසාරිස් ජනරාල්වරයා අදහස් වේ ;

"රේගු බදු" යන්නෙන්, රේගු ආඥාපනත යටතේ පනවා අය කරනු ලබන රේගු බද්ද අදහස් වේ ;

"රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, රේගු ආඥාපනත යටතේ පත් කරන ලද රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ ;

"සුරාබදු අධ්‍යක්ෂ ජනරාල්වරයා" යන්නෙන්, 1989 අංක 13 දරන සුරාබදු (විශේෂ විධිවිධාන) පනත යටතේ පත් කරන ලද සුරාබදු අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ ;

"සුරා බද්ද" යන්නෙන්, 1989 අංක 13 දරන සුරාබදු (විශේෂ විධිවිධාන) පනත යටතේ පනවා අය කරනු ලබන සුරා බද්ද අදහස් වේ ;

"කර්මාන්ත ශාලාව" යන්නෙන්, –

(අ) සිගරට්, සුරුට්ටු, බීඩි, සිගරට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ නිෂ්පාදනය කර ගෙන යනු ලබන කවර වුවද පරිශ්‍රයක් අදහස් වේ ; තව ද

(ආ) ඉහත (අ) ඡේදයේ සඳහන් යම් පරිශ්‍රයක් හා සම්බන්ධව පවත්වා ගෙන යනු ලබන යම් ගබඩාවක් හෝ වෙනත් ස්ථානයක් ඊට ඇතුළත් වේ ;

“ආනයනය” යන්නෙන්, ශ්‍රී ලංකාවෙන් පිටත හෝ ශ්‍රී ලංකාවේ සීමාවලින් ඔබ්බෙහි වූ යම් ස්ථානයකින්, නැව් මගින් හෝ ගුවන් මගින් හෝ ශ්‍රී ලංකාවට ගෙන ඒම අදහස් වේ ;

“අමාත්‍යවරයා” යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද්ද වූ සහ මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා අදහස් වේ ;

“පයිප්ප දුම්කොළ” යන්නෙන්, පයිප්පවල බහා පාවිච්චි කළ හැකි හෝ පයිප්ප ආධාරයෙන් දුම්පානය කළ හැකි කැපූ දුම්කොළ හෝ තැලූ දුම්කොළ අදහස් වේ ;

“නියමිත” යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝගවලින් නියම කරනු ලැබූ යන්න අදහස් වේ ;

“විකුණුම් හෝ මිලට ගැනීම්” යන යෙදුම්, ඒවායේ ව්‍යාකරණ ප්‍රභේද සහ සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ කිසිවක් සම්බන්ධයෙන් වූ සජාතීය යෙදුම් ද සමග ගත් කළ, ඒ සිගරැට්, සුරුට්ටු, බීඩි, සිගරැට් ආදේශක හෝ පයිප්ප දුම්කොළ කිසිවක සන්තකය, සාමාන්‍ය වෙළෙහෙළඳමේදී හෝ ව්‍යාපාරික කටයුතුවල දී, මුදලට හෝ විලම්බනය කළ ගෙවීම් මත හෝ වෙනත් අගනා ප්‍රතිෂ්ඨාවක් මත හෝ එක් තැනැත්තකුගෙන් තවත් තැනැත්තකුට පැවරීම අදහස් වේ ;

“ශ්‍රී ලංකා දුම්කොළ” යන්නෙන්, ශ්‍රී ලංකාවේ වවනු ලැබූ දුම් ශාඛයේ කොළ අදහස් වන අතර, ශ්‍රී ලංකාවේ තිබෙන සහ මූලාශ්‍රය ඔප්පු නොකළ දුම්කොළ කිසිවක් ඊට ඇතුළත් වේ ;

“ප්‍රවාහනය” යන්නෙන්, ශ්‍රී ලංකාව තුළ එක් ස්ථානයක සිට තවත් ස්ථානයකට ගෙන යාම අදහස් වේ.

# 1999 අංක 20 දරන කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනත

[ සහතිකය සටහන් කළේ 1999 ජූලි මස 16 වන දින.]

**කෘෂිකාර්මික සහ උද්‍යාන විද්‍යාත්මක භෝග හා ඖෂධීය පැලෑටි, පශු සම්පත්, ධීවර කර්මාන්තය සහ වන වගාව, කෘෂිකාර්මික උපකරණ හා මෙවලම් සහ කෘෂිකාර්මික හා උද්‍යාන විද්‍යාත්මක නිෂ්පාදන ගබඩා කිරීම සහ කල්තබා ගැනීම, ඖෂධීය පැලෑටි නිෂ්පාදන, ධීවර සහ වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන සම්බන්ධයෙන් රක්ෂණය සැලසීම පිණිස කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, කෘෂිකාර්මිකයන් සඳහා වෛද්‍ය ප්‍රතිලාභ සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම සැලැස්වීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 27 දරන කෘෂිකාර්මික රක්ෂණ පනත ඉවත් කිරීම පිණිස ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1999 අංක 20 දරන කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින් මතු 'නියමිත දිනය' යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

## I කොටස

### කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය

2. (1) (මෙහි මින් මතු 'මණ්ඩලය' යනුවෙන් සඳහන් කරනු ලබන) කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ මණ්ඩලය යනුවෙන් හඳුන්වනු ලබන මණ්ඩලයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය, (1) වන උපවගන්තියෙන් ඊට දී ඇති නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් මණ්ඩලය විසින් නඩු පැවරීම ද, මණ්ඩලයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද, කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලය පහත දක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය :-

(අ) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන සභාපතිවරයා ;

(ආ) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ එම අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන මුදල් අමාත්‍යාංශයේ නිලධරයෙක් ;

(ඇ) කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයා ;

(ඈ) ධීවර විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයා ;

(ඉ) පශු සම්පත් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයා ;

(ඊ) කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ එම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරනු ලබන, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ නිලධරයෙක් ;

(උ) ගොවිජන සේවා කොමසාරිස්වරයා හෝ එම කොමසාරිස්වරයා විසින් නම් කරනු ලබන, ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ නිලධරයෙක් ;

(ඌ) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන, 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූල බලපත්‍ර ලත් වාණිජ බැංකුවක ප්‍රධාන විධායක නිලධරයෙක් හෝ ඔහුගේ නාමිකයා ;

(එ) ආණ්ඩුව විසින් පිළිගනු ලැබ ඇති, ජාතික ගොවි සංගමයක නාමිකයා.

4. (1) මණ්ඩලයේ සභාපතිවරයා, (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, ස්වකීය පත්වීම් දිනයේ සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, ඔහු නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

(2) කිසියම් හේතුවක් නිසා ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට මණ්ඩලයේ සභාපතිවරයා තාවකාලිකව අපොහොසත් වුවහොත්, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීමට නිසි හා සුදුසු තැනැත්තකු අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබිය හැකි ය.

(3) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් හා යම් අනුප්‍රමාණ අනුව මණ්ඩලයේ සභාපතිවරයාට පාරිශ්‍රමික ගෙවිය යුතු ය.

(4) අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින්, මණ්ඩලයේ සභාපතිවරයාට තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) අමාත්‍යවරයා විසින් කිසිදු හේතුවක් නොදක්වා, මණ්ඩලයේ සභාපතිවරයා කවර හෝ අවස්ථාවක සභාපති ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

5. (1) මණ්ඩලයේ කවර හෝ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුතු අතර, ඉහත සඳහන් කරන ලද ආකාරයට යටත්ව, මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල කටයුතු කිරීම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය මණ්ඩලය විසින් විධිමත් කර ගනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබුණ ද මණ්ඩලයට ක්‍රියා කළ හැකි ය.

6. (1) මණ්ඩලයේ මුද්‍රාව මණ්ඩලය භාරයෙහි තිබිය යුතු ය.

(2) මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර මණ්ඩලයේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු අතර, ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සාක්ෂියක් වශයෙන් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට අත්සන් තැබිය යුතු ය.

(3) මණ්ඩලයේ මුද්‍රාව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් වෙනස් කරනු ලැබිය හැකි ය.

7. පහත සඳහන් කර්තව්‍ය මණ්ඩලයේ කර්තව්‍ය විය යුතු යː–

(අ) කෘෂිකාර්මිකයන්ට ස්ථාවරත්වය ලබා දීමේ හා කෘෂිකාර්මික නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීමේ පරමාර්ථය ඇතිව, පාඩු වෙනුවෙන් ඔවුන්ට හානි පූරණය සලසන, වැවිලි භෝග, ඖෂධීය පැළෑටි ඇතුළුව භෝග, ධීවර කටයුතු, වන වගාව සහ පශු සම්පත් කටයුතු සම්බන්ධයෙන් කෘෂිකාර්මිකයන්ගේ ප්‍රතිලාභය පිණිස පූර්ණ රක්ෂණ ක්‍රමයක් පිහිටුවා ක්‍රියාත්මක කිරීම ;

(ආ) කෘෂිකාර්මිකයන්ගේ කෘෂි උපකරණ සහ මෙවලම් සහ අනෙකුත් චංචල හා නිශ්චල දේපළ සම්බන්ධයෙන් වූ රක්ෂණ ක්‍රමයක්, කෘෂිකාර්මිකයන්ගේ ප්‍රතිලාභය සඳහා පිහිටුවා ක්‍රියාත්මක කිරීම ;

(ඇ) කෘෂිකාර්මික සහ උද්‍යාන විද්‍යාත්මක නිෂ්පාදන සහ ඖෂධ පැලෑටි, ධීවර සහ වන නිෂ්පාදිත ගබඩා කිරීම සහ කල් තබා ගැනීම සම්බන්ධයෙන් වූ රක්ෂණ ක්‍රමයක් කෘෂිකාර්මිකයන්ගේ ප්‍රතිලාභය සඳහා පිහිටුවා ක්‍රියාත්මක කිරීම ;

(ඈ) කෘෂිකාර්මිකයන්ගේ ප්‍රතිලාභය උදෙසා වෛද්‍ය ප්‍රතිලාභ සහ සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රම පිහිටුවා ක්‍රියාත්මක කිරීම.

8. මණ්ඩලයට පහත දක්වෙන බලතල සියල්ල හෝ ඉන් කවර හෝ එකක් හෝ ක්‍රියාවේ යෙදවිය හැකි ය ː–

(අ) යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්පත් කර ගැනීම, සන්තකයේ තබා ගැනීම, බද්දට හෝ කුලියට ගැනීම, උකස් කිරීම, විකිණීම හෝ වෙනත් ආකාරයකින් බැහැර කිරීම ;

(ආ) මුදල් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් දෙනු ලබන අනුමතය මත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකින් සහ ඇප මත මණ්ඩලයේ කාර්ය සඳහා මුදල් ණයට ගැනීම ;

(ඇ) මණ්ඩලයේ රක්ෂණ ක්‍රියාකාරකම්වල සියලු ම අංශ සම්බන්ධයෙන් පර්යේෂණ පැවැත්වීම, ඊට සහාය වීම සහ ඒ සඳහා දිරි ගැන්වීම ;

(ඈ) මණ්ඩලයේ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු ම ආකාරයේ ගිවිසුම්වලට, සෘජුව ම හෝ තත් කාර්ය සඳහා බලයලත් කවර හෝ නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් හෝ එළඹීම සහ ක්‍රියාත්මක කිරීම ;

(ඉ) මණ්ඩලයේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ කුසලතා වර්ධනය කිරීමේ කාර්යය සඳහා සහ මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම පිණිස අවශ්‍ය තැනැත්තන් පුහුණු කිරීමට අවශ්‍ය පහසුකම් සැපයීමේ කාර්යය සඳහා කවර හෝ දෙයක් කිරීම ;

(ඊ) මණ්ඩලයේ කටයුතු කාර්යක්ෂම ලෙස කිරීම සඳහා අවශ්‍ය යයි මණ්ඩලය සලකන කර්තව්‍ය ඉටු කිරීම පිණිස මණ්ඩලයේ කවර හෝ සාමාජිකයකුට හෝ නිලධරයකුට බලය දීම ;

( උ) මණ්ඩලයේ නිලධරයන්ගේ සහ සේවකයන්ගේ පත්වීම්, උසස්වීම්, පාරිශ්‍රමික, විනය පාලනය, හැසිරීම සහ ඔවුනට නිවාඩු ලබා දීම ඇතුළුව ඔවුන් සම්බන්ධයෙන් රීති සෑදීම ;

(ඌ) මේ පනත යටතේ මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා රාජ්‍ය සංස්ථාවක්, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති කවර හෝ සමාගමක්, සමූපකාර සමිතියක් හෝ වෙනත් කවර හෝ ගොවිජන ආයතනයක් සමග හවුල් ව්‍යාපෘතීන්ට සම්බන්ධ වීම ;

(එ) මණ්ඩලයේ පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීම ;

(ඒ) කාර්යක්ෂමව ඉටුකර ගැනීම සඳහා පවරා දීම අවශ්‍ය යයි මණ්ඩලය සලකන, මණ්ඩලයේ යම් කර්තව්‍යයක් මණ්ඩලයේ පොදු හෝ විශේෂ විධිවිධානවලට යටත්ව, මණ්ඩලයේ සභාපතිවරයාට හෝ ඔහු මගින්, මණ්ඩලයේ යම් සාමාජිකයකුට හෝ නිලධරයකුට පවරා දීම ;

(ඔ) මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීමට අවශ්‍ය යයි හෝ ඊට ආනුෂංගික යයි හෝ මණ්ඩලය අදහස් කරන අනෙකුත් සියලු දේ කිරීම.

9. (1) මණ්ඩලයේ කටයුතු කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි නිලධරයන් හා සේවකයන්, මණ්ඩලය විසින් වරින් වර නිගමනය කරනු ලබන නියම හා කොන්දේසි අනුව මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට පත් කිරීම මණ්ඩලය විසින් කළ හැකි ය.

(2) මණ්ඩලයේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු, ඒ නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් එවැනි ම කැමැත්ත ඇතිව නිශ්චය කළ හැකි කාල සීමාවක් සඳහා මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබීමට හෝ ඒ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබීමට හෝ හැකි ය.

(3) රාජ්‍ය සේවයේ නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තිය, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහු කෙරෙහි ද, ඔහු සම්බන්ධයෙන් ද අදාළ වන්නේ ය.

(4) රාජ්‍ය සේවයෙහි නියුක්ත යම් නිලධරයකු මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තිය, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහු කෙරෙහි ද, ඔහු සම්බන්ධයෙන් ද අදාළ වන්නේ ය.

(5) ආණ්ඩුව සමග නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟ වී ගිවිසුමකට එළඹ සිටින යම් තැනැත්තකු මණ්ඩලය විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන අවස්ථාවක, ඒ තැනැත්තා විසින් මණ්ඩලයට සේවය කරනු ලබන යම් කාලයක් ඒ ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා ආණ්ඩුවට කරනු ලබන සේවය ලෙස සලකනු ලැබිය යුතු ය.

10. මණ්ඩලයේ සියලු ම නිලධරයන් හා සේවකයන්, දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රාජ්‍ය සේවයේ නියුක්ත නිලධරයන් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

11. මණ්ඩලය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එකී පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

12. මණ්ඩලයේ කර්තව්‍ය ඉටු කිරීම ද බලතල ක්‍රියාවේ යෙදවීම ද පිළිබඳව අමාත්‍යවරයා විසින් ලියවිල්ලකින් පොදු හෝ විශේෂ විධාන කරනු ලැබිය හැකි අතර, මණ්ඩලය ඒ විධාන ක්‍රියාත්මක කළ යුතු ය.

II කොටස

**රක්ෂණය**

13. (1) රක්ෂණයේ විෂය කාරණය සහ රක්ෂණය කරන ලද්දේ කවර හානියක් සම්බන්ධයෙන් ද යන කරුණු සලකා බලා, මණ්ඩලය විසින් පිහිටුවන ලද සහ ක්‍රියාවේ යොදවනු ලබන යෝජනා ක්‍රම යටතේ නිකුත් කරනු ලබන රක්ෂණ ඔප්පු වෙනුවෙන් ගෙවිය යුතු වාරික මුදල් ප්‍රමාණ මණ්ඩලය විසින් කලින් කල නිගමනය කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලය විසින් පිහිටුවනු ලැබ ඇති සහ ක්‍රියාවේ යොදවනු ලබන කිසියම් යෝජනා ක්‍රමයක් යටතේ රක්ෂණ ඔප්පුවක් සඳහා මණ්ඩලයට ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලුම් පත්‍රයක් ම මණ්ඩලය විසින් සලකා බැලිය යුතු අතර, ඉල්ලුම් පත්‍රයේ අවංක භාවය පිළිබඳ සෑහීමකට පත් වන්නේ නම්, වෙනත් කරුණු අතර, –

(අ) යෝජනාකරුවන්ගේ අනන්‍යතාව ;

(ආ) රක්ෂණයට විෂය වූ කාරණය ;

(ඇ) රක්ෂිත තැනැත්තාගේ නම ;

(ඈ) රක්ෂණ ආවරණයේ කාල සීමාව ;

(ඉ) රක්ෂිත මුදල ;

(ඊ) වාරික මුදල ;

(උ) රක්ෂණය කරනු ලබන්නේ යම් විනාශ හා පාඩු සම්බන්ධයෙන් ද, ඒ විනාශ හා පාඩු ;

(ඌ) භාරගනු ලබන අවදානම්වලට අදාළ නියම, කොන්දේසි සහ ව්‍යාතිරේක ;

(එ) අනෙකුත් නියමිත විස්තර ;

යන විස්තර ඇතුළත් විය යුතු රක්ෂණ ඔප්පුවක් මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබිය යුතු ය.

14. මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබ ඇති රක්ෂණ ඔප්පුවකින් රක්ෂිත, රක්ෂණයට විෂය වූ දෙය පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් යම් නිශ්චිත හේතුවක් නිසා විනාශ වූ අවස්ථාවක, රක්ෂිත තැනැත්තා විසින් එම රක්ෂණයට විෂය වූ දෙය පිහිටා ඇති ප්‍රදේශය තුළ බලය ඇත්තා වූ ද, මණ්ඩලය විසින් පත් කරනු ලැබුවා වූ ද අනුයෝජිතයා වෙත ඒ විනාශය සිදු වූ දින සිට දින දහහතරක් ඇතුළත ඒ සම්බන්ධයෙන් ඉල්ලීමක් ලියවිල්ලකින් ඉදිරිපත් කළ යුතු ය.

15. රක්ෂිත තැනැත්තා විසින් –

(අ) රක්ෂණයට සම්බන්ධ කිසියම් වැදගත් කරුණක් වසන් කරනු ලැබ ඇත්නම් හෝ වැරදි ලෙස දක්වනු ලැබ ඇත්නම් හෝ රක්ෂණය සම්බන්ධයෙන් යම් වංචාවක් කරනු ලැබ ඇත්නම් ; හෝ

(ආ) ඒ ගිවිසුමේ යම් නියමයක් හෝ කොන්දේසියක් අනුව ක්‍රියා කිරීම පැහැර හැර ඇත්නම්

මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබ ඇති රක්ෂණ ගිවිසුමක් අවලංගු බවට අධිකරණය විසින් ප්‍රකාශ කරනු ලැබියහැකි අතර, ඒ ගිවිසුම සම්බන්ධයෙන් ගෙවන ලද වාරික මණ්ඩලය සතු කරනු ලැබිය හැකි ය.

16. මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබ ඇති රක්ෂණ ඔප්පුවක් හිමි තැනැත්තාට හෝ තැනැත්තන්ට පිළිගත් ණය නියෝජිත ආයතනයක් විසින් දෙනු ලබන ණයක් වෙනුවෙන් ඇපයක් වශයෙන් ඒ රක්ෂණ ඔප්පුව, ඒ රක්ෂණ ඔප්පුවේ හිමියා හෝ හිමියන් විසින් ඒ ආයතනය වෙත පැවරිය හැකි ය.

17. මණ්ඩලය විසින් නිකුත් කරන ලද යම් රක්ෂණ ඔප්පුවක් යටතේ ගෙවිය යුතු යම් මුදලකට යම් තැනැත්තකුට හිමිකම් ඇති අවස්ථාවක සහ යම් පිළිගත් ණය නියෝජිත ආයතනයක් විසින් ඒ තැනැත්තාට දෙන ලද ණයක් සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් හෝ ආපසු ගෙවීම හෝ ඒ ණය වෙනුවෙන් යම් පොලියක් ගෙවීම හෝ වෙනුවෙන් ඒ තැනැත්තාගෙන් ඒ නියෝජිත ආයතනයට යම් මුදලක් අයවිය යුතුව ඇතැයි මණ්ඩලය සෑහීමකට පත් වූ අවස්ථාවක, ඒ රක්ෂණ ඔප්පුව යටතේ ගෙවිය යුතු මුදලින් ඒ පිළිගත් ණය නියෝජිත ආයතනයට ගෙවිය යුතු මුදල අඩු කොට එය ඒ නියෝජිත ආයතනය වෙත යැවීමට මණ්ඩලය විසින් සලස්වනු ලැබිය හැකි ය.

18. රක්ෂණයට විෂය වූ දෙය හානි වීම සම්බන්ධයෙන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය ගණන් බැලීම, මණ්ඩලය සහ රක්ෂිත පුද්ගලයා අතර එළඹි ගිවිසුමේ නියමිතව දක්වා ඇති නියම හා කොන්දේසි අනුව විය යුතු ය.

19. (1) රක්ෂිත තැනැත්තකු විසින් කරන ලද වන්දි ඉල්ලීමක් මණ්ඩලය විසින් බලය පවරනු ලැබූ නිලධරයකු විසින් ප්‍රතික්ෂේප කරනුලැබූ අවස්ථාවක හෝ එකී යම් නිලධරයකු විසින් රක්ෂිත තැනැත්තකුට ප්‍රදනය කරන ලද වන්දි ප්‍රමාණය ගැන ඒ රක්ෂිත තැනැත්තා සෑහීමට පත් නොවූ අවස්ථාවක, ඒ රක්ෂිත තැනැත්තා විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ ප්‍රතික්ෂේප කිරීම හෝ එය ප්‍රදනය කිරීම තමාට නිවේදනය කරනු ලැබූ දින සිට දින තිහක් ඇතුළත, අභියාචනයට හේතු ද දක්වමින් ලිඛිත අභියාචනයක් මණ්ඩලය වෙත ඉදිරිපත් කළ හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ රක්ෂිත තැනැත්තකු විසින් ඉදිරිපත් කරනු ලබන අභියාචනයකින් ඒ අභියාචන අදාළ වන රක්ෂණ ඔප්පුව සම්බන්ධයෙන් අධිකරණයේ නඩුවක් පැවරීමට ඔහු සතු අයිතියට හානියක් නොවිය යුතු අතර, එවැනි යම් නඩුවක් සඳහා කාල සීමාව ගණනය කිරීමේ දී, ඒ අභියාචනය ඉදිරිපත් කිරීමේ දිනයෙන් ආරම්භ වී, එවැනි යම් අභියාචනයක් නිගමනය කරනු ලබන දිනයෙන් අවසන් වන කාල පරිච්ඡේදය නොසලකා හැරිය යුතු ය.

20. ආණ්ඩුව සමග හෝ පුනර් රක්ෂණ ව්‍යාපාරයේ යෙදෙන යම් දේශීය හෝ විදේශීය ආයතනයක් සමග හෝ මණ්ඩලයට පුනර් රක්ෂණ ගිවිසුම්වලට ඇතුළත් විය හැකි ය.

21. (1) මණ්ඩලය විසින් හෝ පරීක්ෂා කිරීමට මණ්ඩලය විසින් බලය පවරනු ලබන යම් නිලධරයකු විසින් යම් නිශ්චිත වගාවක් තිබෙන හෝ යම් රක්ෂිත පශු සම්පත් ඇති යම් ඉඩමකට ඇතුළු වී එය පරීක්ෂා කිරීම හෝ ඊට සම්බන්ධ යම් ලේඛන පරීක්ෂා කිරීම කළ හැකි අතර, ඒ පරීක්ෂණයට ඉඩ දීම සහ සහාය දීම ඒ ඉඩම පරිහරණය කරන සෑම තැනැත්තකුගේ ම යුතුකම වන්නේ ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින සෑම තැනැත්තෙක් ම වරදක් කරන්නේ ය. තවද මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසුව වරදකරු කරනු ලැබූ විට රුපියල් සියයකට නොවැඩි දඩයකට ඔහු යටත් වන්නේ ය.

22. වගාවට හෝ පශු සම්පත්වලට සිදුවන හානි වැළැක්වීම සඳහා හෝ අඩු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පියවර ගන්නා ලෙස මණ්ඩලය විසින් හෝ තත් කාර්යය සඳහා මණ්ඩලය විසින් බලය පවරනු ලැබූ යම් නිලධරයකු විසින් මේ පනත යටතේ රක්ෂිත තැනැත්තකුට හෝ රක්ෂණ ඔප්පු හිමියකුට විධාන කරනු ලැබිය හැකි ය.

## III කොටස

## මුදල් කටයුතු

23. (1) මණ්ඩලයේ මූලික ප්‍රාග්ධනය රුපියල් කෝටි දෙකක් විය යුතු ය.

(2) මණ්ඩලයේ මූලික ප්‍රාග්ධනය ශ්‍රී ලංකාවේ ඒකාබද්ධ අරමුදලින් මණ්ඩලයට ගෙවනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ මූලික ප්‍රාග්ධනය කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයකින් කලින් කල වැඩි කරනු ලැබිය හැකි ය.

24. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදලක් මණ්ඩලයට තිබිය යුතු ය.

(2) ඒ අරමුදලට පහත සඳහන් මුදල් ගෙවිය යුතු ය: –

(අ) 23 වන වගන්තිය යටතේ මණ්ඩලයට ගෙවනු ලබන සියලු මුදල් ;

(ආ) නියමිත දිනට පෙරාතුව ම දිනයේ දී, ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 27 දරන කෘෂිකර්ම රක්ෂණ පනත මගින් පිහිටුවන ලද කෘෂිකාර්මික රක්ෂණ අරමුදලේ බැරට තිබෙන සියලු මුදල් ;

(ඇ) මණ්ඩලය විසින් කරනු ලබන ආයෝජන මත පොලී වශයෙන් මණ්ඩලයට ලැබෙන සියලු මුදල් ;

(ඈ) ත්‍යාග හා පරිත්‍යාග වශයෙන් මණ්ඩලයට ලැබෙන සියලු මුදල් ;

(ඉ) මණ්ඩලයේ බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා සහ කර්තව්‍ය ඉටු කිරීමෙහි ලා මණ්ඩලයට ලැබෙන සියලු මුදල්.

(3) මේ පනත යටතේ මණ්ඩලයේ බලතල හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමෙහි ලා, හා ඉටු කිරීමෙහි ලා මණ්ඩලය විසින් දරනු ලබන යම් වියදමක් පියවීමට අවශ්‍ය සියලු මුදල් ඒ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) අනපේක්ෂිත සිදුවීම්වලින් පැන නගින හිමිකම් දක්වීම් වෙනුවෙන් ගෙවීම් කිරීම සඳහා ස්වකීය අභිමතය පරිදි යොද ගත යුතු සංචිත අරමුදලක් ගොඩ නැගීම සඳහා එක් එක් මුදල් වර්ෂය අවසානයේ දී මණ්ඩලය මුදලක් වෙන් කළ යුතු ය.

25. (1) මණ්ඩලයේ බැදීම් ඉටු කිරීම සඳහා හෝ මණ්ඩලයේ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා හෝ මණ්ඩලයට අවශ්‍ය විය හැකි මුදල්, අමාත්‍යවරයා හා මුදල් විෂයය භාර අමාත්‍යවරයා යන දෙදෙනාගේ ම එකඟත්වය ඇතිව, හෝ එසේ ම වූ එකඟත්වය ඇතිව දෙන ලද යම් පොදු බලයක නියමයන් අනුව, අයිරා ණයකර මාර්ගයෙන් හෝ අන්‍යාකාරයකින් මණ්ඩලය විසින් ණයට ගැනීම හෝ ගිවිස ගෙන ණය වශයෙන් ලබා ගැනීම හෝ කළ හැකි ය.

(2) මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ලබා අමාත්‍යවරයා විසින් දෙනු ලබන කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් පහත සඳහන් කාර්යයන් සියල්ල හෝ ඉන් යමක් සඳහා (1) වන උපවගන්තිය යටතේ ණය මුදලක් වශයෙන් නොවන, අන්‍යාකාරයකින් මුදල් ණයට ගනු ලැබිය හැකි ය :-

(අ) මණ්ඩලයේ ව්‍යාපාරය සඳහා අවශ්‍ය යම් චංචල හෝ නිශ්චල දේපළක් බුක්තියට ලබා ගැනීම හෝ අත්කර ගැනීම ;

(ආ) (1) වන උපවගන්තිය යටතේ ණයට ගනුලැබූ යම් මුදලක් ආපසු ගෙවීම

26. මණ්ඩලයේ ව්‍යාපාරයෙහි කාර්යය සඳහා වහා අවශ්‍ය නොවන මණ්ඩලයේ යම් අරමුදලක්, ලබා ගත හැකි උපරිම පොලී අනුපාතය මත, ඉහළ ප්‍රතිඵල ලැබෙන සුරැකුම්වල මණ්ඩලය විසින් ආයෝජනය කරනු ලැබිය යුතු ය.

27. මණ්ඩලයේ පොත් ඒ ඒ වර්ෂයේ දෙසැම්බර් මස තිස්එක් වන දිනට මණ්ඩලය විසින් තුලනය කරනු ලැබිය යුතු අතර, ඒ ගිණුම් සහ ශේෂ පත්‍රය සකස් කිරීමේ වගකීම පැවරී ඇති නිලධරයා විසින් පිළියෙල කරන ලදුව ඔහු විසින් අත්සන් තබන ලද, ඉහත කී දිනට සාදන ලද මණ්ඩලයේ වත්කම් හා බැරකම් පිළිබඳ සම්පිණ්ඩණයක් අඩංගු ලාභ හා අලාභ ගිණුමක් සහ ශේෂ පත්‍රයක් එකී වර්ෂයට පසුව එන ඊළඟ වර්ෂයේ අප්‍රේල් මාසයේ තිස්වන දිනට පසු නොවන දිනයක සකස් කළ යුතු ය.

28. මණ්ඩලයේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව අදළ විය යුතු ය

## IV කොටස

### පොදු

29. රක්ෂණ පාලන පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, මේ පනතේ විධිවිධාන බල පැවැත්විය යුතු අතර ඒ අනුව, මේ පනතේ විධිවිධාන හා ඒ වෙනත් යම් නීතියේ විධිවිධාන අතර යම් ගැටුමක් හෝ අනනුකූලතාවක් ඇති වූ අවස්ථාවක, මේ පනතේ විධිවිධාන ඒ වෙනත් යම් නීතිය අභිබවා බලපැවැත්විය යුතු ය.

30. (1) (අ) මණ්ඩලය විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලදයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සඳහා මණ්ඩලයට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ මණ්ඩලයේ යම් සාමාජිකයකු, නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් සද්භාවයෙන් කරනු ලැබූ හෝ කරන ලදයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ තැනැත්තාට විරුද්ධව

කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ කරනු ලැබූ යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක ඔහුට විරුද්ධව පවරන ලද යම් සිවිල් නඩුවක දී දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද්දක් බව අධිකරණය පිළිගතහොත් මණ්ඩලයේ මුදලින් ගෙවිය යුතු ය.

31. (1) මණ්ඩලයේ ව්‍යාපාරයෙහි කාර්යය සඳහා ජනරජයේ යම් නිශ්චල දේපළක් අවශ්‍ය වූ අවස්ථාවක, ඒ කාර්යය රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ පිළිබඳ විශේෂ ප්‍රදානයක් කළ හැකි හෝ බද්දක් දිය හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ ආඥාපනතේ විධිවිධාන මණ්ඩලය වෙත ඒ දේපළ පිළිබඳව කරනු ලබන විශේෂ ප්‍රදානයකට හෝ දෙනු ලබන විශේෂ බද්දකට අදළ විය යුතු ය.

(2) මණ්ඩලයේ ව්‍යාපාරයෙහි කාර්යය සඳහා යම් චංචල දේපළක් අවශ්‍ය වූ අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් චංචල දේපළෙහි සන්තකය සහ පරිහරණය මණ්ඩලය වෙත පවරා සතු කර දෙනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ ව්‍යාපාරයෙහි කාර්යය සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම අවශ්‍ය වන්නා වූ ද, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමකින් අමාත්‍යවරයා විසින් යෝජිත අත්කර ගැනීම අනුමත කරනු ලබන්නා වූ ද අවස්ථාවක, ඒ දේපළ පොදු කාර්යයක් සඳහා අවශ්‍යව ඇති ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අත්කර ගෙන මණ්ඩලය වෙත පැවරිය හැකි ය.

(4) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ මණ්ඩලයේ කාර්ය සඳහා යම් නිශ්චල දේපළක් අත්කර ගැනීම සම්බන්ධයෙන් වන්දි වශයෙන් ගෙවිය යුතු යම් මුදලක් මණ්ඩලය විසින් අරමුදලින් ගෙවිය යුතු ය.

32. (1) මේ පනතේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ සහ විධිවිධාන බල ගැන්වීමේ කාර්යය හෝ මේ පනතින් නියම කළ යුතු කාරණා සම්බන්ධයෙන් හෝ අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය එසේ පළ කරනු ලබන දිනයෙහි හෝ නියෝගයේ සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලැබූ සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මනින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොමැතිව එහි අනනුමතයේ දිනයෙහි සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

33. (1) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 27 දරන කෘෂිකාර්මික රක්ෂණ පනත මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 27 දරන කෘෂිකාර්මික රක්ෂණ පනත ඉවත් කරනු ලබන නමුදු –

(අ) ඒ පනතින් ස්ථාපිත කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය එළඹී, එසේම නියමිත දිනට පෙර දිනයේ බල පැවැත්වූ සියලු ගිවිසුම්, නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි මණ්ඩලය සමග එළඹී ගිවිසුම් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ක්‍රියාවේ යොදවනු ලැබිය හැකි ය ;

(ආ) ඒ පනතින් ස්ථාපිත කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය විසින් හෝ ඒ මණ්ඩලයට එරෙහිව පවරන ලදුව නියමිත දිනට පෙර දිනයේ පවත්නා නඩු හා නඩු කටයුතු මණ්ඩලය විසින් හෝ මණ්ඩලයට එරෙහිව පවරන ලද නඩු හෝ නඩු කටයුතු වශයෙන් නියමිත දිනයේ සිට බලපැවැත්වෙන ලෙස සැලකිය යුතු අතර, ඒ අනුව ඒවා ඉදිරියට පවත්වාගෙන යනු ලැබිය හැකි ය ;

(ඇ) ඒ පනතින් ස්ථාපිත කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයට වාසිදයක හෝ ඒ මණ්ඩලයට එරෙහිව දෙන ලදුව නියමිත දිනට පෙර දිනට ඉටු කරනු නොලැබ ඇති සියලු තීන්දු, ප්‍රකාශ සහ ආඥා, අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලයට වාසිදයක හෝ මණ්ඩලයට එරෙහිව දෙනලද තීන්දු ප්‍රකාශ සහ ආඥා වශයෙන් නියමිත දින සිට ක්‍රියාත්මක වන පරිදි සැලකිය යුතු අතර ඒ අනුව ක්‍රියාවෙහි යොදවනු ලැබිය හැකි ය ;

(ඈ) ඒ පනතින් ද, 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතින් ද, 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ පනතින් ද කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයට පවරනු ලැබ හෝ පනවනු ලැබ ඇති සියලු බලතල හා කාර්ය, නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි මණ්ඩලය වෙත පවරනු ලැබ ඇති හෝ පනවනු ලැබ ඇති බලතල හා කාර්ය වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව පිළිවෙළින්, 1987 අංක 12 දරන ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ ද, 1990 අංක 23 දරන ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනතේ ද කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලය යනුවෙන් සඳහනක්, මණ්ඩලය පිළිබඳ සඳහනක් ලෙස සැලකිය යුතු ය.

(ඉ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේදී එම පනත මගින් පිහිටුවන ලද කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයට අයත්ව තිබුණා වූ සහ මණ්ඩලයේ කාර්යය සඳහා ප්‍රයෝජනයට ගන්නා ලද සියලු චංචල හෝ නිශ්චල දේපළ නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, මණ්ඩලය සතු වන්නේ ය.

(ඊ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවැති ඒ පනත මගින් පිහිටුවන ලද කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයේ සියලු ණය හා බැරකම්, නියමිත දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි මණ්ඩලයේ ණය හා බැරකම් ලෙස සැලකිය යුතු ය.

(උ) ඒ පනතින් ස්ථාපිත කෘෂිකර්ම රක්ෂණ මණ්ඩලයේ නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයෙහි සේවයේ නියුක්තව සිටියා වූ ද, මණ්ඩලයේ සේවානියුක්තිය භාරගනු ලැබුවා වූ ද, සියලු නිලධරයන් හා සේවකයන් නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ ඔවුනට අදාළ වූ නියම සහ කොන්දේසිවලට අඩු වාසිසහගත නොවන නියම හා කොන්දේසි යටතේ සේවයේ නියුක්ත කරනු ලැබිය යුතු ය.

(ඎ) නියමිත දිනයට පෙරාතුවම වූ දිනයේ දී, එම පනත මගින් පිහිටුවන ලද කෘෂිකර්ම රක්‍ෂණ මණ්ඩලයේ බැරට ඇති සියලු මුදල්, මේ පනත මගින් පිහිටුවනු ලබන මණ්ඩලයේ අරමුදලට ඒ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි මාරු වන්නේ ය.

34. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

35. මේ පනතෙහි –

"කෘෂිකාර්මිකයා" යන්නෙන්, කෘෂිකර්මාන්තයට, උද්‍යාන විද්‍යාවට, ඖෂධීය පැලෑටිවලට, පශු සම්පත්වලට, ධීවර කර්මාන්තයට හෝ වන වගාවට අදාළ යම් කටයුත්තක් කර ගෙන යන තැනැත්තකු, ගොවිජන සේවා කමිටුවක් හෝ 1979 අංක 58 දරන ගොවිජන සේවා පනත යටතේ පිහිටුවන ලද හෝ ලියාපදිංචි කරන ලද ගොවි සංවිධානයක් හෝ 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක්, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතියක් හෝ තත් කාලයෙහි බලපවත්නා යම් නීතියක් යටතේ ලියාපදිංචි කරන ලද වෙනත් යම් සමිතියක් හෝ යම් රාජ්‍ය නොවන සංවිධානයක් අදහස් වේ ;

"පිළිගත් ණය නියෝජිත ආයතනය" යන්නෙන්, මේ පනතේ කාර්ය සඳහා මණ්ඩලය විසින් තත් කාලයෙහි විධිමත් පරිදි පිළිගනු ලැබ ඇති යම් සමුපකාර සමිතියක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ ;

"ජාතික ගොවි සංගමය" යන්නෙන් සංගමය විසින් සපයනු ලබන සේවා ගැන සලකා අමාත්‍යවරයා විසින් පිළිගනු ලැබූ ජාතික ගොවි සංගමයක් අදහස් වේ ;

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදනු ලැබ ඇති නියෝග වලින් නියමිත බව අදහස් වේ ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන්, ප්‍රදානයක්, ණයක් හෝ වෙනත් ආකාරයකින් රජය විසින් පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් සපයනු ලබන ප්‍රාග්ධනය සහිතව, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ නොවන වෙනත් කවර හෝ ලිඛිත නීතියකින් හෝ එවැනි ලිඛිත නීතියක් යටතේ ස්ථාපනය කරනු ලබන කවර හෝ සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක් අදහස් වේ.

# 1999 අංක 21 දරන ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1999 ජූලි මස 27 වන දින.]

## 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ : –

1. මේ පනත 1999 අංක 21 දරන ජාතික ආරක්ෂක බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනතේ 3 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ : –

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ " සෑම කාර්තුවක් " සඳහා යන වචනවල සිටඒ උපවගන්තියේ අවසානය තෙක් වූ සියලු වචන ඉවත්කොට, ඒ වෙනුවට පහත දක්වෙන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

"සෑම කාර්තුවක් සඳහා හෝ එහි කොටසක් සඳහා, ඒ කාර්තුව හෝ ඒ කොටස සඳහා වූ ඒ තැනැත්තාගේ පිරිවැටුම හෝ එහි කොටසක් මත, මේ පනතේ උපලේඛනයෙහි සඳහන් උචිත අනුප්‍රමාණ අනුව ආගණනය කරනු ලබන (මෙහි මින් මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ආරක්ෂක බද්දක් අය කරනු ලැබිය යුතු ය."

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ –

(අ) (උ) ඡේදයේ "ඒ භාණ්ඩයේ වටිනාකම; සහ" යන වචන වෙනුවට "ඒ භාණ්ඩයේ වටිනාකම ;" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) (ඌ) ඡේදයේ "ඒ අමතර කොටසේ වටිනාකම" යන වචන වෙනුවට "ඒ අමතර කොටසේ වටිනාකම; සහ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) ඒ වගන්තිය අගට පහත දක්වෙන ඡේදය එකතු කිරීමෙන් : –

"(එ) එක්සත් ජාතීන්ගේ සංවිධානයට හෝ ඒ සංවිධානයේ යම් විශේෂිත නියෝජ්‍යායතනයකට හෝ යම් විදේශ ආණ්ඩුවක රාජ්‍යතාන්ත්‍රික දූත මණ්ඩලයට හෝ ඒ දූත මණ්ඩලයේ රාජ්‍යතාන්ත්‍රික කාර්ය මණ්ඩලයේ යම් සාමාජිකයකුට යම් භාණ්ඩයක් විකිණීමෙන් ලැබුණු මුදල් හෝ යම් සේවයක් සැලසීම වෙනුවෙන් ලැබුණු හෝ ලැබිය යුතු යම් මුදලක්."

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) ඒ වගන්තියේ (උ) ඡේදයේ "1997 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන සෑම වර්ෂයක ම සෑම කාර්තුවක් සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට "1997 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව එහෙත් 1998 ඔක්තෝබර් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම වර්ෂයක ම සෑම කාර්තුවක් සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(2) (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දක්වෙන ඡේදය එකතු කිරීමෙන් : –

"(ඌ) 1998 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භ වන කාර්තුව සඳහා –

(i) 1998 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භව 1998 නොවැම්බර් මස 5 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා, 1998 නොවැම්බර් මස පහළොස් වන දින හෝ එදිනට පෙර –

(අ) මේ අනුඡේදයේ (ආ) අයිතමයේ සඳහන් පිරිවැටුම නොවන, ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට හතර හමාරකට ; සහ

(ආ) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන, යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට භාගයකට

සමාන වන මුදලක් ;

(ii) 1998 නොවැම්බර් මස 6 වන දිනයෙන් ආරම්භව 1998 නොවැම්බර් මස 30 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා, 1998 දෙසැම්බර් මස පහළොස් වන දින හෝ එදිනට පෙර –

(අ) මේ අනුඡේදයේ (ආ) අයිතමයේ සඳහන් පිරිවැටුම නොවන, ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට පහ හමාරකට ; සහ

(ආ) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන, යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට භාගයකට

සමාන වන මුදලක් ;

(iii) ඒ කාර්තුවේ අවසානයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර, මේ ඡේදයේ (i) වන අනුඡේදයේ සහ (ii) වන අනුඡේදයේ විධිවිධානවලට අනුකූලව ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල්වල එකතුව ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු බදු මුදලින් අඩු කරනු ලැබූ පසු ලැබෙන මුදල ; සහ

(ඒ) 1999 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන සෑම කාර්තුවක් සඳහා –

(i) ඒ කාර්තුවේ දෙවන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර, ඒ කාර්තුවේ පළමුවන මාසය සඳහා –

(අ) මේ අනුඡේදයේ (ආ) අයිතමයේ සඳහන් පිරිවැටුම නොවන, ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට පහ හමාරකට ; සහ

(ආ) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන, යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට භාගයකට

සමාන වන මුදලක් ;

(ii) ඒ කාර්තුවේ තුන්වන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර ඒ කාර්තුවේ දෙවන මාසය සඳහා –

(අ) මේ අනුඡේදයේ (ආ) අයිතමයේ සඳහන් පිරිවැටුම නොවන, ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට පහ හමාරකට ; සහ

(ආ) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන, යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සෑදීමෙන් ලැබෙන ඒ තැනැත්තාගේ පිරිවැටුමෙන් සියයට භාගයකට

සමාන වන මුදලක් ; සහ

(iii) ඒ කාර්තුවේ අවසානයට ඉක්බිතිව ම එළඹෙන මාසයේ පහළොස් වන දින හෝ එදිනට පෙර, මේ ඡේදයේ (i) වන අනුඡේදයේ සහ (ii) වන අනුඡේදයේ විධිවිධානවලට අනුකූලව ඒ තැනැත්තා විසින් ගෙවන ලද මුදල්වල එකතුව ඒ කාර්තුව සඳහා ඒ තැනැත්තා විසින් ගෙවිය යුතු බදු මුදලින් අඩු කරනු ලැබූ විට ලැබෙන මුදල."

4\. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ : –

(1) ඒ උපලේඛනයේ 7 වන අයිතමයේ "1997 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන සෑම වර්ෂයක ම සෑම කාර්තුවක් සඳහා" යන වචන හා ඉලක්කම් වෙනුවට "1997 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 1998 ඔක්තෝබර් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන සෑම වර්ෂයක ම සෑම කාර්තුවක් සඳහා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපලේඛනය අගට පහත දක්වෙන අයිතමයන් එකතු කිරීමෙන් : –

"8. 1998 ඔක්තෝබර් මස 1 වන දින ආරම්භ වන කාර්තුව සඳහා –

(i) (ii) වන ඡේදයෙහි සඳහන් පිරිවැටුම නොවන –

(අ) 1998 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භව 1998 නොවැම්බර් මස 5 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා වූ පිරිවැටුම මත

සියයට 4 1/2

(ආ) 1998 නොවැම්බර් මස 6 වන දිනයෙන් ආරම්භව 1998 දෙසැම්බර් මස 31 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා වූ පිරිවැටුම මත

සියයට 5 1/2

(ii) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන, යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සැදීමෙන් ලැබෙන පිරිවැටුම මත

සියයට 0.5

9. 1999 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන සෑම වර්ෂයක ම සෑම කාර්තුවක් සඳහා –

(i) මේ අයිතමයේ (ii) වන ඡේදයේ සඳහන් පිරිවැටුම නොවන පිරිවැටුම මත

සියයට 5 1/2

(ii) (203 වන අධිකාරය වන) මෝටර් වාහන පනතේ අර්ථානුකූලව යම් මෝටර් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ ලොරියක් නොවන යම් පිරියත, යන්ත්‍ර හෝ උපකරණ ආනයනය කිරීමෙන් හෝ සැදීමෙන් ලැබෙන පිරිවැටුම මත

සියයට 0.5

5. 1998 නොවැම්බර් මස 6 වන දිනයෙන් ආරම්භව මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් අවසන් වන කාලය තුළ, පිරියත, යන්ත්‍ර හෝ උපකරණ නොවන යම් භාණ්ඩයක් ආනයනය කරන තැනැත්තකුගෙන් ඒ භාණ්ඩයේ වටිනාකමින් සියයට හතර හමාරක් ඉක්මවන මුදලක් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකතු කරනු ලබන අවස්ථාවක, ඒ එකතු කිරීම සියලු කාර්ය සඳහා වලංගු ලෙස කර ඇති බවට සහ වලංගු ලෙස කරනු ලැබූ බවට සලකනු ලැබිය යුතු අතර, ඒ එකතු කිරීම සම්බන්ධයෙන් ඒ රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා, සිවිල් හෝ අපරාධ හෝ වූ සියලු නඩුවලට එරෙහිව මෙයින් හානිපූරණය කරනු ලැබේ.

6. මේ පනත අදාළ වන තැනැත්තකු විසින් 1998 නොවැම්බර් මස 6 වන දින සිට මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය තෙක් වූ කාලසීමාව සම්බන්ධයෙන් ඒ තැනැත්තාගේ ඒ කාලසීමාව සඳහා වූ පිරිවැටුමෙන් සියයට හතර හමාර ඉක්මවන මුදලක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ගෙවීමට මේ පනතේ 2 වන වගන්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මගින් ඒ තැනැත්තාට නියම කරනු ලැබ ඇති අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ කාලසීමාව සඳහා ගෙවීමට මේ පනතේ 2 වන වගන්තියෙන් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියෙන් ඔහුට නියම කරන ලද මුදල සහ ඒ කාලසීමාව සඳහා ඔහු විසින් ගෙවන ලද මුදල අතර වෙනස, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දින සිට දින තිහක් ඇතුළත ඔහු විසින් කොමසාරිස් ජනරාල්වරයාට ගෙවනු ලැබුවහොත්, ඒ තැනැත්තා ඒ වගන්තියේ නියම අනුව ක්‍රියා කර ඇතැයි සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය. ඒ වෙනස එසේ ගෙවා නොමැති අවස්ථාවක, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වීමේ දින සිට දින තිහක් ඉකුත් වීමෙන් පසු ඒ වෙනස ගෙවීම පැහැර හැර ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ප්‍රධාන ප්‍රඥප්තියේ අර්ථානුකූලව ඒ තැනැත්තා ඒ දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ගෙවීම පැහැර හැර ඇති තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය.

7. මේ පනතේ 2(2) වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියට කරන ලද සංශෝධනය, 1999 අප්‍රේල් මස 1 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

8. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 1999 අංක 22 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකුව (සංශෝධන) පනත

[ සහතිකය සටහන් කළේ 1999 අගෝස්තු මස 12 වන දින.]

## 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ : –

1. මේ පනත 1999 අංක 22 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකුව (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනතේ 3 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ : –

(1) ඒ වගන්තියෙහි (3) වන උපවගන්තියෙහි "බැංකුවේ මුද්‍රාව" යන වචන වෙනුවට "(4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, බැංකුවේ මුද්‍රාව" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) ඒ වගන්තියෙහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් : –

"(4) අසනීපයක් හෝ තාවකාලිකව ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ මණ්ඩලයේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් තිබීම නිසා හෝ (3) වන උපවගන්තිය යටතේ, සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මුද්‍රාව තැබිය නොහැකි වූ අවස්ථාවක දී, බැංකුවේ එක් සාමාජිකයකු සහ බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයා ඉදිරිපිට දී ඕනෑම සාධන පත්‍රයකට හෝ ලියවිල්ලකට මුද්‍රාව තැබීම කළ හැකි වේ."

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ : –

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් : –

"(1) බැංකුවෙහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය කොළඹ පිහිටා තිබිය යුතු අතර බැංකුවේ ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා අවශ්‍ය විය හැකි ශාඛා තබා ගැනීම සහ නියෝජිත ආයතන හා අනුයෝජිතයන් පත් කිරීමද කරනු ලැබිය හැකි ය; තවද තැන්පතු ජංගණනය කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත අනුයෝජිතයන් පත් කිරීම සහ නියෝජිත කාර්යාල පිහිටුවීම ද කළ හැකිය ;" සහ

(2) ඒ වගන්තියෙහි (2) වන උපවගන්තියේ "නියෝජිත ආයතනයක් හෝ නියෝජිතයකු වශයෙන් බැංකුව විසින් පත් කළ හැකි ය.", යන වචන වෙනුවට "අනුයෝජිතයකු වශයෙන් බැංකුව විසින් පත් කළ හැකි ය." යන වචන ආදේශ කිරීමෙන්.

4. 1995 අංක 28 දරන පනතින් සංශෝධිත පරිදි ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ : –

(1) "මේ පනතේ විධිවිධානවලට" යන වචන වෙනුවට "මේ පනත හෝ වෙනත් නීතියක් යටතේ සාදන ලද නියෝගයන් හෝ නිකුත් කරන ලද විධාන ඇතුළුව, මේ පනතේ සහ එකී වෙනත් නීතියක විධිවිධානවලට," යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියෙහි (අ) ඡේදයෙහි "ඉතිරිකිරීමේ ගිණුම් විවෘත කිරීම සහ ඉතිරිකිරීමේ සහතික නිකුත් කිරීම" යන වචන වෙනුවට "ඉතිරිකිරීමේ සහතික හෝ ඉතිරිකිරීම් ජංගණනය කිරීමට බැංකුවට හැකි කරවන වෙනත් යම් සාධන පත්‍රයක් හෝ නිෂ්පාදනයක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(3) ඒ උපවගන්තියෙහි (ඉ) ඡේදයේ "ස්වකීය ගණුදෙනුකරුවන්ගේ තැන්පතුවල ඇපය මත" යන වචන වෙනුවට "ස්වකීය ගණුදෙනුකරුවන්ගේ තැන්පතුවල ඇපය මත හෝ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වෙනත් යම් ඇපයක් හෝ ඇපවීමක් මත" යන වචන ආදේශ කිරීමෙන් ;

(4) ඒ උපවගන්තියෙහි (ඊ) ඡේදයේ "ඇප මත, නිවාස ණය සැපයීම" යන වචන වෙනුවට "ඇප මත නිවාස ණය හෝ වාණිජ්‍යමය නොවන අරමුණු සඳහා වෙනත් ණය සැපයීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(5) ඒ උපවගන්තියේ (ඌ) ඡේදයේ "යම් නිශ්චල හෝ චංචල දේපළක් හෝ ඒ දේපළ පිළිබඳ යම් අයිතිවාසිකමක් අත්කර ගැනීම" යන වචන වෙනුවට "මිලට ගැනීමෙන්, බද්දට ගැනීමෙන්, හුවමාරු කිරීමෙන්, කුලියට ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් යම් නිශ්චල හෝ චංචල දේපළක් හෝ ඒ දේපළ පිළිබඳ යම් අයිතිවාසිකමක් අත්කර ගැනීම" යන වචන ආදේශ කිරීමෙන් ;

(6) ඒ උපවගන්තියේ (ඒ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් : –

"(ඒ) මණ්ඩලය විසින් අනුමත කරන ලද මූල්‍යායතන සහ මිල ලැයිස්තුගත සමාගම් මගින් නිකුත් කරන ලද හෝ ඇප වන ලද මුදල් සාධන පත්‍ර වෙළෙඳම් කිරීම" ;

(7) ඒ උපවගන්තියේ (ඒ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද එකතු කිරීමෙන් : –

"(ඔ) මධ්‍යම සහ දීර්ඝ කාලීන ව්‍යාපෘති සඳහා නැවත ණය දීමේ කාර්යය උදෙසා බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට ප්‍රතිමූල්‍ය පහසුකම් සැලසීම ;

(ඕ) තැන්පතුවලට ප්‍රතිපක්ෂව ඇපකර ලිපි නිකුත් කිරීම ;

(ක) දේශීය සහ ජාත්‍යන්තර ආයතන හෝ නියෝජ්‍ය ආයතනවලින් මුදල් ණයට ගැනීම ;

(ග) ලොතරැයි සහ ත්‍යාග තරඟ පැවැත්වීම ;

(ච) යම් බලපත්‍රලත් වාණිජ බැංකුවක හෝ බලපත්‍ර ලත් විශේෂ බැංකුවක හෝ බලපත්‍රලත් වාණිජ බැංකුවක නැතහොත් බලපත්‍රලත් විශේෂ බැංකුවක උපකාරක ආයතනයක හෝ බලපත්‍රලත් කොටස් හුවමාරුපොලක ලැයිස්තුගත කළ හෝ ලැයිස්තුගත කිරීම අපේක්ෂා කරන හෝ පොදු සමාගමක, සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනයෙහි ආයෝජනය කිරීම ;

(ජ) අනේවාසිකයන් සඳහා රුපියල් ගිණුම් විවෘත කිරීම ;

(ට) තැන්පතුකරුවන්ගෙන් විදේශ ව්‍යවහාර මුදල් එකතු කිරීම සහ මෙරට මුදල්වලට අපවර්තනය කිරීම ;

(ඩ) සේවාදායකයන්ට ආරක්ෂක භාරය සහ සුරැකි අත්භාරය සුරැකි තැන්පතු ලෙස යතුරු දමා වැසීමේ පහසුකම් සැලසීම ;

(ණ) මූල්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි කොන්දේසි වලට යටත්ව උගස් බඩු ව්‍යාපාර පවත්වාගෙන යෑම ;

(ත) මුදල් මාරුකිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම ;

(ද) මූල්‍ය මණ්ඩලයේ ලිඛිත අනුමැතිය ඇතිව උපකාරක සමාගම් පිහිටුවීම ;

(න) භාර සහ බුදල පරිපාලනය භාර ගැනීම ;

(ප) ඉහත සඳහන් කර්තව්‍ය සහ ක්‍රියාකාරකම්වලට ආනුෂංගික හෝ හිතකර විය හැකි වෙනත් යම් ක්‍රියාකාරකම්වල යෙදීම"

5. 1995 අංක 28 දරන පනතින් සංශෝධිත පරිදි ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය එහි (1) වන උපවගන්තියේ "බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයා" යන වචන වෙනුවට "බැංකුවේ ප්‍රධාන විධායක නිලධරයා වන බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයා" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

6. 26 වන වගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 26අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය : –

" සාමාන්‍යාධිකාරිවරයා සහ වෙනත් යම් නිලධරයකු වෙත බලතල පැවරීම.

26අ (1) බලය පැවරීම සඳහා මණ්ඩලය විසින් සම්මත කරගනු ලබන යෝජනා සම්මතයක සඳහන් යම් නියම හා කොන්දේසිවලට යටත්ව මණ්ඩලය විසින් ඒ යෝජනා සම්මතය මගින් බැංකුවේ යම් කර්තව්‍ය හෝ ක්‍රියාකාරකම් කිසිවක් බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයාට හෝ වෙනත් යම් නිලධරයකුට හෝ කලින් කල පවරනු ලැබිය හැකි අතර, එවැනි යම් පැවරීමක් මණ්ඩලය විසින් අවලංගු කිරීම හෝ අස්කර ගැනීම ද කළ හැකිය.

(2) (1) වන උපවගන්තිය යටතේ බැංකුවේ සාමාන්‍යාධිකාරිවරයාට හෝ බැංකුවේ වෙනත් යම් නිලධරයකුට යම් බලතල පැවරීමක් කරනු ලැබුව ද, එසේ පවරන ලද කර්තව්‍යයක් හෝ කටයුත්තක් ඉටු කිරීමට හෝ ක්‍රියාත්මක කිරීමට අයිතිවාසිකමක් මණ්ඩලයට ඇත්තේ ය.''.

7. 1995 අංක 28 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට මෙහි පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ : –

'' පොලිය ගෙවිය යුතු බව

41. හිමිකම් පානු නොලැබූ තැන්පතු සංචිතයක මුදල් තැන්පත් කර තිබූ කාලසීමාව සඳහා ඒ සංචිතයට මාරු කරන ලද මුදල් මත පොලිය ද ඇතුළුව, බැංකුවෙහි තැන්පත් කරන ලද මුදල් මත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි අනුප්‍රමාණවලට අනුව බැංකුව විසින් පොලී ගෙවනු ලැබිය යුතු ය.''.

8. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 41 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 42 වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය : –

'' පොලියට අමතරව ගෙවීම්.

42. මණ්ඩලය විසින් , නිශ්චිතව දක්වනු ලැබිය හැකි ගිණුම් පන්ති සඳහා සහ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි අනුප්‍රමාණවලට අනුව, පොලියට අමතරව ගෙවීම් කරනු ලැබිය හැකි ය.''.

9. 1995 අංක 28 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ (4) වන උපවගන්තියෙහි ''එම ගිණුමේ තිබුණු මුදල් ප්‍රමාණයට සමාන මුදලක් හිමිකම් පාන්නාට ගෙවා'' යන වචන වෙනුවට''41 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි අනුප්‍රමාණවලට අනුව ගණන් බලනු ලැබූ පොලිය ද සමඟ ගිණුමේ තිබූ මුදලට සමාන මුදලක් හිමිකම් පාන්නාට ගෙවා'' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

10. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 78 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය : –

'' උකස්කරුවන්ගේ ආඥාපනත අදාළ නොවිය යුතු බව

79. (90 වන අධිකාරය වූ) උකස්කරුවන්ගේ ආඥා පනතේ විධිවිධාන බැංකුව විසින් පවත්වාගෙන යනු ලබන උකස් ව්‍යාපාරය සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.''.

11. 1995 අංක 28 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ : –

(1) ''භාරකරු'' යන්නෙහි අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ආදේශ කිරීමෙන් : –

''බලපත්‍රලාභී වාණිජ බැංකුව සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුව'' යන්නෙහි 1988 අංක 30 දරන බැංකු පනතේ පිළිවෙළින් ඒවාට දී ඇති අර්ථය ම තිබිය යුතු ය ; සහ

(2) ''ඉතිරිකිරීමේ සහතිකය'' යන යෙදුමෙහි අර්ථකථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අර්ථකථනය ඇතුළත් කිරීමෙන් : –

''ඉතිරිකිරීමේ සාධන පත්‍රයක් හෝ ප්‍රදර්ශකයක්'' යන්නෙන්, ඉතිරිකිරීම් ජංගණනය කිරීම සඳහා බැංකුවට හැකිවන යම් සාධන පත්‍රයක් හෝ ප්‍රදර්ශකයක් අදහස් වේ''.

12. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 1999 අංක 24 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1999 අගෝස්තු මස 30 වන දින.]

## 1995 අංක 16 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ : –

1. මේ පනත 1999 අංක 24 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1995 අංක 16 දරන මුදල් පනතේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ : –

" ඩීසල් මෝටර් වාහන වාර්ෂික බද්ද.

2. පිළිවෙළින් 1995 අප්‍රේල් මස 1 වන දිනෙන් සහ 1996 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භවන වර්ෂ සඳහා සෑම ඩීසල් මෝටර් වාහනයක් වෙනුවෙන්ම රුපියල් දසදහසක සමාන මුදල් ප්‍රමාණයක සහ 1997 අප්‍රේල් මස 1 වන දින සිට හෝ ඉන් පසුව ආරම්භවන සෑම වර්ෂයක් සඳහාම රුපියල් පන් දහසකට සමාන මුදල් ප්‍රමාණයක (මේ කොටසෙහි 'බද්ද' යනුවෙන් සඳහන් කරනු ලබන) ඩීසල් මෝටර් වාහන බද්දක් නියම කර අයකළ යුතු අතර ගෙවිය යුතු ද වන්නේ ය. ඒ සෑම වර්ෂයක් සඳහා ගෙවිය යුතු බද්ද ඩීසල් මෝටර් වාහනයේ ලියාපදිංචි කළ අයිතිකරු විසින් අදාළ දිනයේ දී හෝ එදිනට පෙර ගෙවිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ "එහෙත් අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා (අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් නොවන) සෑම සුඛෝපභෝගී මෝටර් වාහනයක්" යන වචන වෙනුවට "එහෙත් අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා (අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් හෝ වැගන් රථයක් නොවන) සෑම සුඛෝපභෝගී මෝටර් වාහනයක්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තියේ "එහෙත් අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා සෑම අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනයක් වෙනුවෙන් ම" යන වචන වෙනුවට "එහෙත් අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා (අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් හෝ වැගන් රථයක් නොවන) සෑම අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනයක් වෙනුවෙන්ම" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ "එහෙත් අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා සෑම අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් වෙනුවෙන්ම" යන වචන වෙනුවට "එහෙත් අවුරුදු හතකට නොවැඩි කාලයක් සඳහා (වැගන් රථයක් නොවන) සෑම අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනයක් වෙනුවෙන් ම" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ "අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද සහ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහන බද්ද සහ ඊට එකතු කරන ලද යම් දණ්ඩන මුදලක්" යන වචන වෙනුවට "අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහන බද්ද සහ අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහන බද්ද" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියෙහි 7අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය : –

" ප්‍රයෝජනයට නොගැනීම නිසා ඩීසල් මෝටර් වාහන බද්දෙන් නිදහස් කිරීම.

"7අ. මෝටර් වාහන පනතේ 37 වන වගන්තිය යටතේ හෝ මෝටර් වාහන පනතට අදාළව වූ පළාත් සභාවක යම් ප්‍රඥප්තියක ඊට අනුරූප යම් විධිවිධානයක් යටතේ මෝටර් වාහනයක ලියාපදිංචි කළ අයිතිකරු විසින් ඒ අවුරුද්දේ මාස හයකට වැඩි කාලයක් සඳහා ප්‍රයෝජනයට නොගැනීම පිළිබඳ දන්වීමක් දී ඇති බවට කොමසාරිස්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු විසින් යම් වර්ෂයක් සඳහා ගෙවිය යුතු ඩීසල් මෝටර් වාහන බද්දේ මුළු ප්‍රමාණයම හෝ එහි යම් කොටසක් ගෙවීමෙන් ඒ ලියාපදිංචි අයිතිකරු කොමසාරිස්වරයා විසින් නිදහස් කරනු ලැබිය හැකි ය.".

8. 8 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 8අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය : –

" ලියාපදිංචි අයිතිකරු රජය හෝ පළාත් පාලන ආයතනය වන විට.

8අ. 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන කුමක් වුවද, යම් නිශ්චිත මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු, අවස්ථාවෝචිත පරිදි, රජය හෝ පළාත් පාලන ආයතනයක් වන අවස්ථාවක, ඒ ලියාපදිංචි අයිතිකරු විසින් බද්ද යම් රක්ෂකයකු වෙත ගෙවනු ලැබිය යුතු අතර, 8 වන වගන්තියේ (2) වන (3) වන (4) වන (5) වන හා (6) වන උපවගන්තිවල සහ 9 වන වගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඒ ගෙවීමට අදාළ විය යුතු ය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ : –

" බද්ද ගෙවූ බව ලියාපදිංචි අයිතිකරු ඔප්පු කළ යුතු බව.

9. (1) සෑම නිශ්චිත මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු විසින්, ඒ මෝටර් වාහනය සඳහා යම් වර්ෂයක් වෙනුවෙන් රක්‍ෂණ ඔප්පුවක් නිකුත් කරන ලෙස හෝ අලුත් කරන ලෙස අයදුම් කරන විට, ඒ නිශ්චිත මෝටර් වාහනය සඳහා ඒ වර්ෂය සහ ඊට පෙරාතුව වූ වර්ෂය වෙනුවෙන් බද්ද ගෙවූ බවට සාක්ෂි, රක්‍ෂකයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් කරන ලද යම් බදු ගෙවීමක් පිළිබඳව සාක්ෂි පෙන්වීමට ලියාපදිංචි අයිතිකරුවකුට නොහැකි වන අවස්ථාවක, රක්‍ෂකයා විසින් ඒ නොගෙවීම කොමසාරිස්වරයා වෙත වහාම දැනුම් දිය යුතු ය.".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තිය මෙයින් පහත දක්වෙන ලෙස සංශෝධනය කරනු ලැබේ : –

(1) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "කාලසීමාව ඇතුළත, එසේ පැහැර හැර ඇති බද්ද" යන වචන වෙනුවට "කාලසීමාව ඇතුළත, එසේ පැහැර හැර ඇති බද්ද සහ ඊට එකතු කරන ලද යම් දණ්ඩන මුදලක් " යන වචන ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් : –

"(4) (අ) පැහැරහැරි තැනැත්තා යම් නිශ්චිත මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු වන අවස්ථාවක, දැන්වීම ඔහු වෙත පෞද්ගලිකව ම භාර කරනු ලැබුවහොත් හෝ ඒ වාහනය ලියාපදිංචි කිරීමේ සහතිකයේ දක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබුවහොත් ; හෝ

(ආ) පැහැරහැරි තැනැත්තා රක්‍ෂකයකු වන අවස්ථාවක, දැන්වීම ඔහු වෙත පෞද්ගලිකව ම භාර කරනු ලැබුවහොත් හෝ ඔහුගේ ලියාපදිංචි කාර්යාලයේ හෝ ප්‍රධාන ව්‍යාපාර ස්ථානයේ ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබුවහොත්

ඒ දැන්වීම පැහැරහැරි තැනැත්තා වෙත යථා පරිදි භාර කරනු ලැබුවාක් සේ සැලකිය යුතු ය. ලියාපදිංචි තැපෑලෙන් යවන ලද දැන්වීමක් සම්බන්ධයෙන් වන විට, එය ඔහුට සාමාන්‍යයෙන් භාර දෙනු ලැබිය හැකිව තිබුණ දින දී එය පැහැරහැරි තැනැත්තා වෙත ලැබුණු සේ සැලකිය යුතු ය."

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා පිළිවෙළින් ප්‍රධාන ප්‍රඥප්තියේ 10අ සහ 10ආ වගන්ති වශයෙන් බලපැවැත්විය යුතු ය : –

" දණ්ඩන මුදල අත්හැරීමට හෝ අඩු කිරීමට කොමසාරිස්වරයා සතු බලය.

10අ. අදාළ දිනයට පෙර බද්ද ගෙවීමට ලියාපදිංචි අයිතිකරු අසමත් වූයේ ලියාපදිංචි අයිතිකරුගේ පාලනයෙන් බැහැර වූ හේතු නිසා බවට ද සියලු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගත් කළ, 10 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ ගෙවිය යුතු දණ්ඩන මුදල අත්හැරීම හෝ අඩු කිරීම සාධාරණ සහ යුක්ති සහගත බවට ද කොමසාරිස්වරයා සෑහීමට පත්වන්නේ නම්, කොමසාරිස්වරයා විසින් එම දණ්ඩන මුදල අත්හැරීම හෝ අඩු කිරීම කළ හැකි ය.

10ආ. පැහැරහැර ඇති සේ සලකනු ලබන බද්දක් සම්බන්ධයෙන් වූ දණ්ඩන මුදලක් මෝටර් වාහනයක ලියාපදිංචි අයිතිකරු විසින් ගෙවනු ලැබූ අවස්ථාවක, අදළ දිනයට පෙර බද්ද ගෙවීමට ලියාපදිංචි අයිතිකරු අසමත් වූයේ ලියාපදිංචි අයිතිකරු ගේ පාලනයෙන් බැහැර වූ හේතු නිසා බවට ද සියලු අවස්ථාගත කරුණු සැලකිල්ලට ගත් කල ගෙවා ඇති දණ්ඩන මුදල හිලව් කිරීම හෝ ආපසු ගෙවීම සාධාරණ සහ යුක්ති සහගත බවට ද කොමසාරිස්වරයා සෑහීමට පත්වන්නේ නම්, කොමසාරිස්වරයා විසින් –

(අ) ඒ ලියාපදිංචි අයිතිකරු විසින් ගෙවන ලද දණ්ඩන මුදල, අනතුරුව එළඹෙන යම් වර්ෂයක් සඳහා ඔහු විසින් ගෙවිය යුතු බද්ද වෙනුවෙන් හිලව් කරනු ලැබිය හැකි ය.

(ආ) ඒ ලියාපදිංචි අයිතිකරු විසින් ගෙවන ලද දණ්ඩන මුදල ආපසු ගෙවිය හැකි ය.".

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ : –

" බද්ද අයකර ගැනීම.

11. 10 වන වගන්තිය යටතේ යවන ලද දැන්වීමක සඳහන් දිනය ඉකුත් වීමට පෙරාතුව බදු මුදල සහ ඊට එකතු කරන ලද යම් දණ්ඩන මුදලක් ගෙවා නොමැති අවස්ථාවක, එම බදු මුදල සහ ඊට එකතු කරන ලද යම් දණ්ඩන මුදලක් පැහැර හැරි තැනැත්තාගේ නම සහ අන්තිමට දන සිටි පදිංචි ස්ථානය ද දැක්වෙන සහතිකයක්, ඒ ස්ථානය පිහිටි කොට්ඨාශය විෂයයෙහි අධිකරණ බලය ඇති මහෙස්ත්‍රාත්වරයා වෙත කොමසාරිස්වරයා විසින් නිකුත් කරනු ලැබිය හැකි ය. එවිට මහෙස්ත්‍රාත්වරයා විසින් බද්ද සහ ඊට එකතු කරන ලද යම් දණ්ඩන මුදලක් අය කර ගැනීම සඳහා ඒ ගෙවීම පැහැරහැරිය තැනැත්තාට විරුද්ධව වැඩිදුර නඩු කටයුතු නොපැවැත්විය යුත්තේ මන්ද යන්නට කරුණු දැක්වීමට ඔහු තමා ඉදිරියට කැඳවිය යුතු ය. ප්‍රමාණවත් හේතු නොපෙන්වුවහොත් නොගෙවා පැහැර හැරිය බද්ද සහ ඊට එකතු කරන ලද යම් දණ්ඩන මුදලක් දඩයකින් පමණක් දඬුවම් කළ යුතු හෝ බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් නොකළ යුතු වරදක් සඳහා එම පැහැර හැරිය තැනැත්තාට මහේස්ත්‍රාත් වරයාගේ දණ්ඩන නියමයකින් නියමිත දඩයක් ලෙස සැලකිය යුතු අතර, එවිට එවැනි වරදක් සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උපවගන්තියේ විධිවිධාන (එහි (අ), (ඇ) සහ (එ) ඡේදවල විධිවිධාන හැර) අදාළ විය යුතු ය. ඒ දණ්ඩන නියමය කරන වේලාවෙහි ඒ උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර මහෙස්ත්‍රාත්වරයා විසින් කළ හැකි යම් විධානයක් ඔහු විසින් කළ හැකි ය".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ "ඔහු විසින් එම බද්ද" යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට "ඔහු විසින් එම බද්ද 1996 සැප්තැම්බර් 5 වන දින හෝ ඊට ප්‍රථමයෙන් කොමසාරිස්වරයා වෙත ගෙවුවහොත්, ඒ ලියාපදිංචි අයිතිකරු විසින්, එකී නියමය අනුව ක්‍රියාකර ඇත්තාක් සේ සැලකිය යුතු ය. එවැනි බද්දක් එසේ ගෙවනු නොලැබූ අවස්ථාවක, ඒ දිනය ඉකුත් වූ පසු එම බද්ද පැහැරහැර ඇති ලෙස සැලකිය යුතු අතර එම දිනයේ සිට මේ පනතේ අර්ථානුකූලව ඒ ලියාපදිංචි අයිතිකරු ගෙවීම පැහැරහැරි අයකු ලෙස සැලකිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) "මෝටර් බයිසිකලය" යන වචනවල සිට "අර්ථයම ඇත්තේ ය" යන වචන දක්වා වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

"රෝගී වාහනය", "මෝටර් ගිලන් රථය", "මෝටර් බයිසිකලය", "මෝටර් අවමංගල රථය" සහ "මෝටර් ට්‍රයිසිකලය" "මගී බස් රථය හා පුද්ගලික කෝච් රථය" යන්නට මෝටර් වාහන පනතේ පිළිවෙලින් ඒවාට දී ඇති අර්ථම ඇත්තේ ය";

(2) "මෝටර් වාහනය" යන අර්ථ කථනයෙහි "ලොරියක්" යන වචනයේ සිට එහි අවසානය දක්වා වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

"ලොරියක්, මගී බස් රථයක්, පුද්ගලික කෝච් රථයක්, ට්‍රැක්ටරයක් හෝ අත් ට්‍රැක්ටරයක් හෝ ට්‍රේලරයක් නොවන්නා වූ ද (රියදුරු ඇතුළුව) දහ දෙනකුට නොවැඩි සංඛ්‍යාවක් හෝ ඔවුන්ගේ බඩුබාහිරාදිය ගෙන යාම සඳහා තනා ඇති හෝ සකසා ඇති යාන්ත්‍රිකව ධාවනය වන කවර හෝ වාහනයක් අදහස් වේ";

(3) "අර්ධ සුඛෝපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය" යන අර්ථ කථනය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ කථනය ආදේශ කිරීමෙන් :–

"අර්ධ සුඛොපභෝගී ද්විත්ව කාර්ය මෝටර් වාහනය" යන්නෙන්, ද්විත්ව කාර්ය සඳහා ලියාපදිංචි කර තිබෙන සුඛෝපභෝගී මෝටර් වාහනයක් හෝ අර්ධ සුඛෝපභෝගී මෝටර් වාහනයක් අදහස් වේ";

(4) "නිශ්චිත මෝටර් වාහනය" යන අර්ථ කථනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ කථනය ඇතුළත් කිරීමෙන් :–

"වැගන් රථය" යන්නෙන්, තනි ඒකකයක් වශයෙන් සැලසුම් කරන ලද්ද වූ ද, මගීන් හෝ බඩු නැතහොත් මගීන් සහ බඩු ප්‍රවාහනය කිරීමේ කාර්ය සඳහා සාදන ලද්ද වූ හෝ යොද ගන්නා ලද්ද වූ ද මෝටර් වාහනයක් අදහස් වේ".

16. මේ පනතේ 2 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තියෙහි කරන ලද සංශෝධනය 1997 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ සේ සලකනු ලැබිය යුතු ය.

17. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 1999 අංක 25 දරන මුද්දර ගාස්තු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1999 අගෝස්තු මස 30 වන දින.]

## 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ : –

1. මේ පනත 1999 අංක 25 දරන මුද්දර ගාස්තු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1996 අංක 38 දරන පනතින් අවසන් වරට සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ : –

(1) එම වගන්තියේ (24) වන ඡේදය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් : –

"(24) ණය සුරැකුම්පතක් හෝ ණය සුරැකුම්පතක් විකිණීමට හෝ පැවරීම සඳහා ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක් ;" සහ

(2) ඒ වගන්තිය අගට පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් : –

"(27) භාණ්ඩාගාර බිල්පත්වලට හෝ ආණ්ඩුවේ සුරැකුම්පත්වලට අදාළව යම් ප්‍රාථමික අලෙවිකරුවකු සමග ඇති කර ගන්නා ලද නැවත මිලට ගැනීමේ ගිවිසුමක්.".

3. 1996 අංක 6 දරන පනතින් සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තියේ "ඇටෝර්නි බලය" යන යෙදුමේ අර්ථ කථනයට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් අර්ථ කථනය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ : –

"ප්‍රාථමික අලෙවිකරු" යන්නෙන් භාණ්ඩාගාර බිල්පත් හෝ ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ගණුදෙනු කිරීමේ කාර්යය සඳහා ප්‍රාථමික අලෙවිකරුවකු වශයෙන් දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥාපනත යටතේ හෝ ලියාපදිංචි ස්කන්ධ සහ සුරැකුම්පත් ආඥාපනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් පත්කරන ලද යම් වාණිජ බැංකුවක්, සමාගමක් හෝ වෙනත් තැනැත්තෙක් අදහස් වේ ;.

4. පිළිවෙලින් මේ පනතේ 2 වන වගන්තිය සහ 3 වන වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියට සහ 71 වන වගන්තියට කරන ලද සංශෝධන, 1998 නොවැම්බර් මස 6 වන දින සිට බලාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 1999 අංක 29 දරන ණය සහනදයක (සංශෝධන) පනත

[ සහතිකය සටහන් කළේ 1999 සැප්තැම්බර් මස 17 වන දින.]

**ණය සහනදයක ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 1999 අංක 29 දරන ණය සහනදයක (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (81 වන අධිකාරය වූ) ණය සහනදයක ආඥාපනතේ 19අ වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් : –

"(1අ) මේ ආඥාපනතේ අර්ථානුකූලව උකසක් වශයෙන් සලකනු ලබන නිශ්චල දේපළක පැවරීමක් මගින් ආරක්ෂා කරන ලදයි උද්දේශිත ණයක් සම්බන්ධයෙන් ණය කරුවකු හෝ ණය හිමියකු විසින් ඉදිරිපත් කරන ලද යම් ඉල්ලීමක්, ඒ පැවරුම සිදු කරනු ලැබූ නොතාරිස්වරයකු විසින් ලියා සහතික කරන ලද සාධන පත්‍රයේ දින සිට අවුරුදු තුනක් ඇතුළත ඉදිරිපත් කරන ලද්දේ නම් මිස, මණ්ඩලය විසින් භාර ගනු නොලැබිය යුතු ය;

එසේ වුවද, පවරන ලද දේපළක සන්තකය දරන ණයකරුවකු විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක්, එම උපවගන්තියේ සඳහන් කාල සීමාවෙන් පසු භාර ගැනීමෙන් මණ්ඩලය වළක්වන ලෙසට මේ උපවගන්තියේ සඳහන් කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියෙහි "(1) වන උපවගන්තියේ" යන වචන හා ඉලක්කම් වෙනුවට "එම වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ (1අ) උපවගන්තියේ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 19ආ වගන්තියේ "එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි" යන වචන හා ඉලක්කම් වෙනුවට "එම වගන්තියේ (1) වන උපවගන්තියේ හෝ (1අ) උපවගන්තියේ" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 21අ වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) එම වගන්තිය, එම වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන් ;

(2) එම වගන්තියේ නැවත අංක යෙදූ (1) වන උපවගන්තියෙහි –

(අ) "නිශ්චල දේපළක්" යන වචන වල සිට "සැලකිල්ලට ගනු ලැබිය යුතු ය." යන වචන දක්වා වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට පහත දක්වෙන කොටස ආදේශ කිරීමෙන් : –

"නිශ්චල දේපළ පිළිබඳ පැවරුමක් හෝ පොරොන්දු සින්නක්කරයක් පිළිබඳ අයදුම් පත්‍රයක් සම්බන්ධයෙන් මේ ආඥාපනත යටතේ වූ යම් විභාගයක දී, (70 වන අධිකාරය වූ) වංචා වැළැක්වීමේ ආඥාපනතේ 2 වන වගන්තියෙහි හෝ (14 වන අධිකාරය වූ) සාක්ෂි ආඥාපනතේ 91 වන සහ 92 වන වගන්තිවල කුමක් සඳහන් වුවද, එම පැවරීම හෝ පොරොන්දු සින්නක්කරය ඇත්ත වශයෙන්ම උකසක් ද නැද්ද යන්න තීරණය කිරීමේ කාර්යය සඳහා මණ්ඩලය විසින් නඩුවේ සියලු අවස්ථානුගත කරුණු ද විශේෂයෙන්ම පහත දක්වෙන කරුණු ද සැලකිල්ලට ගනු ලැබිය යුතුය : –";

(ආ) එම උපවගන්තියෙහි (ඇ) ඡේදයෙහි "නීත්‍යානුකූලව ක්‍රියාත්මක කළ හැකි ගිවිසුමක්" යන වචන වෙනුවට "කවර හෝ ආකාරයක වූ යම් ගිවිසුමක්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) එම වගන්තියේ අවසානයට පහත දක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් : –

"(2) නිශ්චල දේපළ පැවරීමක් ඇත්ත වශයෙන්ම උකස් කිරීමක් බව පෙන්වීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීමේ වගකීම, පැවරුම්කරු සතු විය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 වන වගන්තියේ (2) වන උප වගන්තියෙහි "ණය හිමියාට අයවිය යුතු ණය සම්බන්ධයෙන් අදාළ වන තාක් කල් එම ඉල්ලීම, මණ්ඩලය විසින් නිශ්ප්‍රභ කරනු ලැබිය යුතු අතර" යන වචන ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ : –

"(ආ) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුවද, නඩුවේ සියලු අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන සාධාරණ යයි මණ්ඩලයට පෙනී යන යම් මුදලක් පොලී වශයෙන් ලබා ගැනීමට ණය හිමියකුට අවසර දිය යුතු ය."

7. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 39 වන වගන්තියේ (2) වන උප වගන්තියේ (අ) ඡේදයෙහි "උචිත ආඥාවක් කරනු ලැබිය හැකි ය." යන වචන වෙනුවට "උචිත ආඥාවක් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

8. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 64 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ : –

(1) "ණය හිමියා" යන්නෙහි අර්ථ කථනයෙහි "නිශ්චල දේපළක් පිළිබඳ පොරොන්දු සින්නක්කරයක්" යන වචන වෙනුවට "නිශ්චල දේපළක් පිළිබඳ පැවරීමක් හෝ පොරොන්දු සින්නක්කරයක්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) "උකස" යන්නෙහි අර්ථ කථනයෙහි "ඒ දේපළ පිළිබඳ පොරොන්දු සින්නක්කරයක් " යන වචන වෙනුවට "ඒ දේපළ පිළිබඳ පැවරීමක් හෝ පොරොන්දු සින්නක්කරයක්" යන වචන ආදේශ කිරීමෙන්.

9. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 1999 අංක 30 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1999 සැප්තැම්බර් මස 23 වන දින.]

**1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ : –

1. මේ පනත 1999 අංක 30 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 17 දරන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතේ 68 වන වගන්තිය "මේ කොටසේ විධිවිධාන යටතේ හැර" යන වචන වෙනුවට, "මේ කොටසේ හෝ VIIඅ කොටසේ විධිවිධාන යටතේ හැර" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. පහත දක්වෙන අලුත් කොටස, ප්‍රධාන ප්‍රඥප්තියේ VII වන කොටසට ඉක්බිතිව ම, මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය, ප්‍රධාන ප්‍රඥප්තියේ VIIඅ කොටස වශයෙන් බලපැවැත්විය යුතු ය : –

" VIIඅ කොටස

**අධිකාරියට අයත් නිවාස, මහල් නිවාස සහ වෙනත් යම් ගොඩනැගිලිවල සන්තකය, ඒ නිවාස, මහල් නිවාස සහ ගොඩනැගිලිවල අනවසරයෙන් සන්තකය හෝ පදිංචිය ලබා ඇති තැනැත්තන්ගෙන් සාමාන්‍යාධිකාරිවරයා විසින් ආපසු ලබාගැනීම.**

මේ කොටස අදාළ වන්නා වූ නිවාස, මහල් නිවාස සහ වෙනත් ගොඩනැගිලි සහ "ගොඩනැගිල්ල" යන යෙදුමේ අර්ථකථනය.

69අ. (මෙහි මින් මතු "ගොඩනැගිල්ල" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිකාරියට අයත් සෑම නිවාසයකට ම, මහල් නිවාසයකට ම හෝ වෙනත් ගොඩනැගිල්ලකට ම මෙම කොටස අදාළ විය යුතු ය.

69ආ. (1) යම් ගොඩනැගිල්ලක හෝ එහි යම් කොටසක යම් තැනැත්තකු අනවසරයෙන් සන්තකය හෝ පදිංචිය ලබා ඇති බව විශ්වාස කිරීමට තරම් සාමාන්‍යාධිකාරිවරයාට හේතු ඇති අවස්ථාවක, ඔහු විසින්, ඒ තැනැත්තා වෙත නිවේදනයක් භාරදීමට කටයුතු සැලැස්විය යුතු අතර, ඒ දන්වීමේ සඳහන් දින හෝ ඊට පෙර ඔහුගේ යැපෙන්නන් වෙතොත්, ඔවුන් ද සමග ඒ ගොඩනැගිල්ල හෝ එහි කොටස අත්හැර, එහි නිරවුල් සන්තකය සාමාන්‍යාධිකාරිවරයා වෙත හෝ නිවේදනයෙහි සඳහන් ඒ සඳහා ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු වෙත හෝ භාර දිය යුතු යයි නියම කරනු ලැබිය යුතු ය. නැතහොත්, එම භාරදීම අවස්ථානුකූල නොවේ යයි හෝ ක්‍රියාත්මක කළ නොහැකි යයි සාමාන්‍යාධිකාරිවරයා විසින් සලකනු ලබන අවස්ථාවක, ඔහු විසින් ඒ දන්වීම ඒ ගොඩනැගිල්ල තුළ හෝ ඒ මත ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශනය කරනු ලැබිය යුතු අතර, දන්වීමේ සඳහන් දින හෝ ඊට පෙර ඔහුගේ යැපෙන්නන් වෙතොත්, ඔවුන් ද සමග ඒ ගොඩනැගිල්ල හෝ එහි කොටස අත්හැර, එහි නිරවුල් සන්තකය සාමාන්‍යාධිකාරිවරයා වෙත හෝ නිවේදනයෙහි සඳහන් ඒ සඳහා ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු වෙත හෝ භාර දිය යුතුයයි නියම කරනු ලැබිය යුතු ය. එබඳු සෑම දන්වීමක් ම දෙවන උපලේඛනයේ සඳහන් 'අ' ආකෘතියට සාරානුකූල විය යුතු අතර, එය මෙහි මින් මතු මේ කොටසෙහි "අස්කිරීමේ නිවේදනය" යනුවෙන් සඳහන් විය යුතු ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ කාර්ය සඳහා අස්කිරීමේ නිවේදනයේ සඳහන් දිනය ඒ නිවේදනය නිකුත් කිරීමේ හෝ ප්‍රදර්ශනය කිරීමේ දින සිට දින හැටක් පසු නොවන්නා වූ දිනයක් විය යුතු ය.

(3) යම් තැනැත්තකු වෙත භාර දීමට නියමිත නිවේදනයක් ඒ තැනැත්තාගේ ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යවනු ලැබිය හැකි අතර, ඒ අනුව අස්කිරීමේ නිවේදනයක්, ඒ නිවේදනය ඇතුළත් ලිපිය, එය යැවූ ලිපිනයට බෙදා දුන් අවස්ථාවේ දී ඒ තැනැත්තා වෙත භාර දුන් ලෙස සලකනු ලැබිය යුතු ය.

69ඈ. 69ආ වගන්තිය යටතේ විධිවිධාන සලස්වා ඇති පරිදි අස්කිරීමේ නිවේදනයක් භාර දුන් හෝ ප්‍රදර්ශනය කරනු ලැබූ අවස්ථාවක, නිවේදනය අදාළ වන්නේ යම් ගොඩනැගිල්ලක් සම්බන්ධයෙන් ද ඒ ගොඩනැගිල්ලේ අනවසරයෙන් සන්තකය හෝ පදිංචිය ලබා ඇති තැනැත්තා හෝ ඔහුගේ යැපෙන්නන් හෝ වෙනත් පදිංචිකරුවන් වෙතොත්, ඔවුන් ද සමග ඒ ගොඩනැගිල්ලෙන් හෝ එහි කොටසින් යථා පරිදි ඉවත් වී, ඒ ගොඩනැගිල්ලේ හෝ එහි කොටසේ සාමකාමී නිරවුල් සන්තකය සාමාන්‍යාධිකාරීවරයා හෝ නිවේදනයේ සඳහන්, ඒ සඳහා ඔහු විසින් බලය දෙන ලද යම් තැනැත්තකු වෙත භාර දිය යුතු ය.

69ඇ. (1) යම් ගොඩනැගිල්ලක් හෝ එහි යම් කොටසක අනවසරයෙන් සන්තකය හෝ පදිංචිය ලබා ඇති යම් තැනැත්තකු, 69ආ වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි භාර දෙන ලද්ද වූ හෝ ප්‍රදර්ශනය කරන ලද්ද වූ අස්කිරීමේ නිවේදනයට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලැබ ඇති අවස්ථාවක, සාමාන්‍යාධිකාරීවරයා විසින්, මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති 'ආ' ආකෘතියට සාරානුකූලව ඉල්ලීමක්, ඒ ගොඩනැගිල්ල හෝ එහි යම් කොටසක් පිහිටියේ යම් අධිකරණ බලසීමාවක් ඇතුළත ද ඒ අධිකරණ බලසීමාවේ මහෙස්ත්‍රාත්වරයා වෙත පහත දක්වෙන කරුණු සඳහන් කරමින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය : -

(i) ඔහු අධිකාරියේ සාමාන්‍යාධිකාරීවරයා බව ;

(ii) ඉල්ලීමේ උපලේඛනයේ විස්තර කර ඇති ගොඩනැගිල්ල අධිකාරියට අයත් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක කොටසක් බව ;

(iii) අස්කිරීමේ දැන්වීම ඒ ගොඩනැගිල්ලේ සන්තකය හෝ පදිංචිය ලැබූ තැනැත්තා වෙත භාර දුන් බව හෝ ඒ ගොඩනැගිල්ල තුළ හෝ ඒ ගොඩනැගිල්ල මත ප්‍රකට ස්ථානයක ප්‍රදර්ශනය කළ බව ;

(iv) ඉල්ලීමේ නම සඳහන් තැනැත්තා ඒ ගොඩනැගිල්ලේ හෝ එහි කොටසක අනවසරයෙන් සන්තකය හෝ පදිංචිය ලබා ඇති බව සහ ඒ ගොඩනැගිල්ල හෝ එහි කොටස අත්හැරීමට සහ 69ඇ වගන්තිය මගින් නියමිත පරිදි මෙහි සන්තකය භාර දීමට අපොහොසත් වී ඇති බව; තවද,

ඒ ඉල්ලීමෙන්, ඒ ගොඩනැගිල්ලේ හෝ එහි යම් කොටසක සන්තකය ආපසු ලබාගැනීම සඳහා සහ ඒ ගොඩනැගිල්ලේ සන්තකයෙන් හෝ පදිංචියෙන් ඒ තැනැත්තා ඔහුගේ යැපෙන්නන් සහ වෙනත් පදිංචිකරුවන් ඇතොත්, ඔවුන් ද නෙරපීම සඳහා ආයාචනය කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම ඉල්ලීමක් ම, මේ පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති 'ඇ' ආකෘතියට සාරානුකූල වූ ද ඒ ඉල්ලීමෙන් ඉදිරිපත්කර ඇති කරුණු තහවුරු කෙරෙන්නා වූ ද දිවුරුම් පත්‍රයක් මගින් සනාථ කළයුතු අතර, අස්කිරීමේ නිවේදනයේ පිටපතක් සමග එය එවිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් වූ ද (2) වන උපවගන්තියේ සඳහන් දිවුරුම් පත්‍රයෙන් සහ අස්කිරීමේ නිවේදනයේ පිටපතකින් සනාථ කෙරෙන්නා වූ ද සෑම ඉල්ලීමක් ම, මෙහි මින් මතු මේ කොටසේ "නෙරපීම සඳහා වූ ඉල්ලීම" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(4) 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ කුමක් සඳහන් වුවද, නෙරපීම සඳහා වූ යම් ඉල්ලීමක් සම්බන්ධයෙන් කිසිම මුද්දර ගාස්තුවක් ගෙවනු නොලැබිය යුතු ය.

69ඉ. (1) 69ඇ වගන්තිය යටතේ කරන ලද ඉල්ලීමක් ලැබුණු විට මහෙස්ත්‍රාත්වරයා විසින් ඉල්ලීමෙහි නම් කර ඇති තැනැත්තා වෙත ඉල්ලීමෙහි පිටපතක් ද සමග වහාම සිතාසි නිකුත් කරනු ලැබ, ඒ සිතාසියෙහි සඳහන් දින (ඒ සිතාසිය නිකුත් කරනු ලැබූ දින පටන් දෙසතියක් පසු නොවන දිනයක) පෙනී සිට, ඒ තැනැත්තා සහ ඔහුගේ යැපෙන්නන් වෙතොත් ඔවුන් ද, නෙරපීම සම්බන්ධයෙන් වූ ඉල්ලීමෙහි අයැද ඇති පරිදි ගොඩනැගිල්ලෙන් හෝ එහි යම් කොටසකින් නෙරපනු නොලැබිය යුත්තේ මන්දැයි හේතු දක්වීමට නියම කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද සිතාසියෙහි සඳහන් දින, සිතාසි නිකුත් කරන

ලද්දේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා අධිකරණයේ පෙනී සිටීම පැහැර හරින්නේ නම් හෝ නෙරපීම සම්බන්ධයෙන් වූ ආඥාවට එරෙහිව දක්වීමට හේතුවක් නොමැති බව අධිකරණයට දක්වන්නේ නම්, ඒ තැනැත්තා සහ ඔහුගේ යැපෙන්නන් වෙතොත්, ඔවුන් ද ගොඩනැගිල්ලෙන් හෝ එහි යම් කොටසකින් වහාම නෙරපිය යුතු බවට විධාන කෙරෙන ආඥාවක් අධිකරණය විසින් වහාම නිකුත් කරනු ලැබිය යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ සිතාසි නිකුත් කරන ලද්දේ යම් තැනැත්තකු වෙත ද ඒ තැනැත්තා ඒ සිතාසියෙහි සඳහන් දින පෙනී සිට, නෙරපීම සම්බන්ධයෙන් වූ ආඥාවක් නිකුත් කිරීමට එරෙහිව තමාට දක්වීමට හේතු ඇති බව ප්‍රකාශ කරන්නේ නම්, මහෙස්ත්‍රාත් අධිකරණය විසින්, කාරණය විභාගකර නිශ්චය කිරීම සඳහා වහාම කටයුතු කිරීම හෝ යම් පසු දිනක විභාග කිරීම සඳහා නඩුව ඉවත තැබීම කරනු ලැබිය හැකි ය.

(4) නෙරපීම සම්බන්ධයෙන් වූ යම් ඉල්ලීමක් 69ඇ වගන්තිය යටතේ මහෙස්ත්‍රාත් අධිකරණයක් වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ ඉල්ලීම විභාගකර, අවසන් කිරීම සම්බන්ධයෙන්, වෙනත් කටයුතු කලින් විභාග කොට, අවසන් කිරීම අවශ්‍ය යයි අවස්ථාගත කරුණු යෙදී ඇති විටක දී හැර, ඒ අධිකරණයේ එවැනි වෙනත් සියලු කටයුතු වලට වඩා වැඩි ප්‍රමුඛත්වයක් දෙනු ලැබිය යුතු ය.

(5) ඒ විභාගයේ දී, 69ඇ වගන්තිය යටතේ ඉල්ලීමෙහි ප්‍රකාශිත කරුණු ඇසුරෙන් කවර වූ හෝ කරුණක් පිළිබඳව හබ කිරීමට (1) වන උපවගන්තිය යටතේ සිතාසි ලැබූ තැනැත්තා හිමිකම් නොලැබිය යුතු අතර, වලංගු අවසර පත්‍රයක් මත හෝ අධිකාරිය සමග හෝ පාලන කොටස් අධිකාරිය විසින්ම දරනු ලබන යම් සමාගමක් හෝ රාජ්‍ය සංස්ථා එකක් හෝ වැඩි ගණනක් සමග ඇතුළත් වූ යම් වලංගු ලිඛිත ගිවිසුමක් යටතේ ගොඩනැගිල්ලේ හෝ එහි යම් කොටසක තමා සන්තකය දරන බව හෝ පදිංචි වී ඇති බවත්, ඒ අවසරපත්‍රය හෝ වලංගු ලිඛිත ගිවිසුම බලාත්මකව පවතින බව සහ එය ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබ හෝ අන්‍යාකාරයකින් නිර්බල නොකර ඇති බවත් ඒ තැනැත්තා විසින් තහවුරු කරනු ලැබිය හැකි ය.

(6) 69ඇ වගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීම සනාථ කිරීම සඳහා සාමාන්‍යාධිකාරීවරයාගෙන් යම් සාක්ෂියක් කැඳවීමට මහෙස්ත්‍රාත් අධිකරණයට නිසි බලය නැත්තේ ය.

(7) විභාගයෙන් පසුව, හේතු දක්වන තැනැත්තා ගොඩනැගිල්ලේ හෝ එහි යම් කොටසක සන්තකයට හෝ පදිංචියට හිමිකමක් ඇති බවට මහෙස්ත්‍රාත්වරයා සෑහීමට පත් නොවන්නේ නම්, ඒ ගොඩනැගිල්ලේ හෝ එහි කොටසෙහි පදිංචි වී ඇති ඒ තැනැත්තා හෝ ඔහුගේ යැපෙන්නන් වෙතොත්, ඔවුන් ද ඒ ගොඩනැගිල්ලෙන් හෝ එහි කොටසින් වහාම නෙරපිය යුතු බවට විධාන කෙරෙන ආඥාවක් මහෙස්ත්‍රාත්වරයා විසින් කරනු ලැබිය යුතු ය.

(8) ඉහත විධිවිධාන වල කුමක් සඳහන් වුවද, (1) වන උපවගන්තිය යටතේ සිතාසි භාරදෙනු ලැබූ තැනැත්තා ගොඩනැගිල්ලේ හෝ එකී කොටසෙහි පදිංචියට ඇතුළු වූ ආකාරය ගැන සලකා බලන විට ඔහු නෙරපීමට ආඥා කිරීම අයුක්ති සහගත බව මහෙස්ත්‍රාත්වරයාගේ මතය වන අවස්ථාවක, විධානයේ දිනයෙන් මාස හයක කාලයක් ඇතුළත මහෙස්ත්‍රාත්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි සාධාරණ නියම මත එම ගොඩනැගිල්ල හෝ කොටස සම්බන්ධයෙන් ගිවිසුමකට එළඹෙන ලෙස මහොස්ත්‍රාත්වරයා විසින් එම තැනැත්තාට සහ අධිකාරියට නියම කළ හැකි ය ;

එසේ වුවද (1) වන උප වගන්තිය යටතේ සිතාසි භාරදෙනු ලැබූ තැනැත්තා එම නියමයේ දින සිට මාස හයක කාලයක් ඇතුළත ගිවිසුමකට එළඹීමට අසමත්වන අවස්ථාවක මේ කොටසේ අඩංගු විධිවිධාන අවශ්‍ය වෙනස්කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(9) (2) වන උපවගන්තිය හෝ (7) වන උපවගන්තිය යටතේ මහෙස්ත්‍රාත්වරයකු විසින් කරන ලද යම් නෙරපීමේ ආඥාවකට එරෙහිව කිසිම අභියාචනයක් නොපැවතිය යුතු ය.

(10) (2) වන උපවගන්තිය හෝ (7) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවකට අනුකූලව ක්‍රියා කිරීම, යම් තැනැත්තකු විසින් පැහැර හරිනු ලබන අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින් සාමාන්‍යාධිකාරීවරයාගේ ඉල්ලීම මත, අධිකරණයේ පිස්කල් වෙත වහාම සන්තකය පිළිබඳ රිට් ආඥාවක් නිකුත් කිරීම, සහ අවශ්‍ය නම් නැවත නිකුත් කිරීම කරනු ලැබිය යුතු ය. තවද, ඒ රිට් ආඥාව නිකුත් කිරීමේ දින සිට සම්පූර්ණ දින තුනකට කලින් නොවන සහ දින හතක් පසු නොවන දිනයක් වූ, රිට් ආඥාවේ සඳහන් දිනයකට පෙර, ඒ ගොඩනැගිල්ලේ හෝ එහි කොටසේ සන්තකය සාමාන්‍යාධිකාරීවරයා

වෙත හෝ ගොඩනැගිල්ලට අදාළ අස්කිරීමේ නිවේදනයේ සඳහන් ඒ සඳහාම ඔහු විසින් බලය දෙන ලද වෙන යම් තැනැත්තකු වෙත හෝ භාර දෙන ලෙසට ඒ පිස්කල්ට නියම කර බලය දිය යුතු ය. එකී පිස්කල්ට හෝ ඒ සඳහා අධිකරණය විසින් බලය දෙන ලද යම් පොලිස් නිලධරයකුට, අවශ්‍ය යයි පිස්කල් හෝ පොලිස් නිලධරයා සලකන යම්තාක් සහායකයන් සමග ඒ ගොඩනැගිල්ලට ඇතුල් වී, සන්තකයේ හෝ පදිංචියේ සිටින තැනැත්තා සහ ඔහුගේ යැපෙන්නන් හෝ පදිංචිකරුවන් වෙතොත්, ඔවුන් ද ඒ ගොඩනැගිල්ලෙන් හෝ එහි කොටසින් නෙරපීමට ඒ රිට් ආඥාව ප්‍රමාණවත් අධිකාරයක් වන්නේ ය.

(11) වෙනත් යම් නීතියක කුමක් සඳහන් වුවද, (9) වන උපවගන්තිය යටතේ සන්තකය පිළිබඳ රිට් ආඥාවක් නිකුත් කිරීම හෝ නැවත නිකුත් කිරීම, සන්තකය පිළිබඳ ඒ රිට් ආඥාව හෝ සන්තකය පිළිබඳ ඒ රිට් ආඥාව නිකුත් කිරීම හෝ නැවත නිකුත් කිරීම සම්බන්ධයෙන් හෝ සන්තකය පිළිද ඒ රිට් ආඥාව නිකුත් කරන ලද්දේ හෝ නැවත නිකුත් කරන ලද්දේ යම් අස්කිරීමේ නිවේදනයක් අනුව ද ඒ අස්කිරීමේ නිවේදනය නිකුත් කිරීම හෝ නැවත නිකුත් කිරීම සම්බන්ධයෙන් ප්‍රශ්න කිරීමේ අදහසින් යම් අධිකරණයක දී ගනු ලැබූ හෝ ගැනීමට යෝජිත පියවර කිසිවක් හේතු කොටගෙන කවර වූ හෝ ආකාරයකින් නතර කරනු නොලැබිය යුතු ය.

(12) මේ වගන්තිය යටතේ යම් ගොඩනැගිල්ලකින් හෝ එහි යම් කොටසකින් තමා නීති විරෝධී ලෙස නෙරපන ලදැයි හිමිකම් පාන යම් තැනැත්තකු, ඒ නෙරපීම සම්බන්ධයෙන් අලාභ හෝ වෙනත් සහන ලබාගැනීම සඳහා යම් අධිකරණයක නඩුවක් පැවරීමෙන් වළක්වාලන ලෙසට මේ කොටසේ කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.

මේ කොටසේ විධිවිධාන මේ පනතේ හෝ වෙනත් ලිඛිත නීතියක වෙනත් යම් විධිවිධාන අභිබවා බලපැවැත්විය යුතු බව.

69ඊ. මේ පනතේ වෙනත් යම් විධිවිධානයක හෝ වෙනත් ලිඛිත නීතියක කුමක් සඳහන් වුවද, මේ කොටසේ විධිවිධාන බලපැවැත්විය යුතු අතර, ඒ අනුව, මේ කොටසේ විධිවිධාන සහ වෙනත් යම් විධිවිධානයක් හෝ ලිඛිත නීතියක් අතර යම් ගැටුමක් හෝ අනනුකූලතාවක් ඇතිවුවහොත්, මේ කොටසේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

මේ කොටස සඳහා අර්ථ නිරූපණය.

69උ. මේ කොටසේ කාර්ය සඳහා :–

"අනවසර සන්තකය හෝ පදිංචිය" යන්නට අධිකාරිය සමග හෝ අධිකාරිය විසින් ම හෝ රාජ්‍ය සංස්ථා එකක් හෝ වැඩි ගණනක් සමග පාලන කොටස් දරනු ලබන්නා වූ යම් සමාගමක් සමග ලියවිල්ලක් මගින් ඇතුළත් වූ වලංගු ගිවිසුමක් මත වන සන්තකය හා යම් තැනැත්තකුගේ හෝ ඔහුගේ මරණින් පසු ඔහුගේ උරුමක්කරුවන්ගේ පදිංචිය හැර, සෑම ආකාරයක ම සන්තකයක් හෝ පදිංචියක් ඇතුළත් වේ ;

"අධිකාරියට අයත් නිවාස, මහල් නිවාස සහ වෙනත් ගොඩනැගිලි" යන්නට, අධිකාරිය විසින් තනන ලද්ද වූ හෝ අධිකාරිය විසින් ම හෝ රාජ්‍ය සංස්ථා එකක් හෝ වැඩි ගණනක් සමග පාලන කොටස් දරනු ලබන්නා වූ සමාගමක් විසින් රජයේ ඉඩමක හෝ අධිකාරියට හෝ ඒ සමාගමට බදු දී ඇති රාජ්‍ය සංස්ථාවකට අයත් වන්නා වූ ඉඩමක තනන ලද්ද වූ සෑම නිවාසයක්, මහල් නිවාසයක් හෝ වෙනත් ගොඩනැගිල්ලක් ඇතුළත් වේ".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 82 වන වගන්තිය "උපලේඛනය" යන වචන වෙනුවට, "පළමුවන උපලේඛනය" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයට ඉක්බිතිව ම, පහත දක්වෙන උපලේඛනය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය, ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය වශයෙන් බලපැවැත්විය යුතු ය.

## දෙවන උපලේඛනය

'අ' ආකෘතිය

අස්කිරීමේ නිවේදනය (69ආ වගන්තිය)

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ, සාමාන්‍යාධිකාරී ..................................................(නම හා පදවි නාමය සඳහන් කරන්න) වන මම, ..................................................(නම සඳහන් කරන්න) වන ඔබ මෙහි උපලේඛනයේ විස්තර කර ඇති ගොඩනැගිල්ලේ/*එහි කොටසක අනවසරයෙන් සන්තකය/* පදිංචිය ලබා ඇති බැව් විශ්වාස කිරීමට තරම් හේතු ඇතිව, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතේ 69ආ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ..................................................(නම සඳහන් කරන්න) වන ඔබට –

(අ) ඔබේ යැපෙන්නන් හෝ වෙනත් පදිංචිකරුවන් වෙතොත්, ඔවුන් ද සමග ඒ ගොඩනැගිල්ල අත්හැර යා යුතු බවට; සහ

(ආ) ඒ ගොඩනැගිල්ලේ හෝ එහි කොටසේ සාමකාමී නිරවුල් සන්තකය මා වෙත /* හෝ මා වෙනුවෙන් ක්‍රියාකිරීමට බලය දී ඇති ..................................................(නම සහ පදවි නාමය සඳහන් කරන්න) ..................................................තැනැත්තා වෙත ..................................................(දිනය සඳහන් කරන්න) වන දින හෝ ඊට පෙර භාරදිය යුතු බවට

නියම කරමි.

අත්සන
සාමාන්‍යාධිකාරී

*අදාළ නොවන්නේ නම් කපා හරින්න.

ඉහත සඳහන් උපලේඛනය

(දිස්ත්‍රික්කයේ නම ද ඇතුළුව ගොඩනැගිල්ලේ පිහිටීම ද දක්වමින් ඒ පිළිබඳ විස්තර මෙහි සඳහන් කරන්න)

දිනය : ..................................................

අත්සන
සාමාන්‍යාධිකාරී

"ආ" ආකෘතිය

නෙරපීම සඳහා වූ ඉල්ලීම (69ඈ වගන්තිය)

.......................................................................................................................................මහෙස්ත්‍රාත් අධිකරණය වෙත (ඒ අධිකරණයේ නම සඳහන් කරන්න) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී (නම සඳහන් කරන්න) ..................................................................................................... වන මම, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතේ 69ඈ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙම ඉල්ලීම මගින් –

(අ) පහත දැක්වෙන කරුණු ඉදිරිපත් කරමි. එනම් –

(i) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී මම වෙමි.

(ii) මේ ඉල්ලීමේ උපලේඛනයෙහි විස්තර කර ඇති ගොඩනැගිල්ල හෝ ගොඩනැගිල්ලේ කොටස ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලක කොටසක් වේ.

(iii) අස්කිරීමේ නිවේදනයක් ( එහි පිටපතක් මේ ඉල්ලීමට අමුණා ඇත.)...................................................................... වෙත (නම සහ ලිපිනය දක්වන්න) භාර දී ඇත/* එකී ගොඩනැගිල්ල තුළ හෝ එකී ගොඩනැගිල්ල මත ප්‍රදර්ශනය කරනු ලැබ ඇත ;

(iv) එකී (නම සඳහන් කරන්න) .......................................................................................එකී ගොඩනැගිල්ලේ හෝ එහි කොටසේ අනවසරයෙන් සන්තකය/* පදිංචිය ලබාගෙන ඇති අතර, ඒ පනතේ 69ඈ වගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හැර ඇත ;

(ආ) එකී ගොඩනැගිල්ලේ හෝ එහි කොටසේ සන්තකය ආපසු ලබා ගැනීම සඳහා සහ එකී ගොඩනැගිල්ලෙන් හෝ එහි කොටසක/එකී ...........................................................................................................(නම සඳහන් කරන්න) ඔහුගේ යැපෙන්නන් සහ වෙනත් පදිංචිකරුවන් වෙතොත්, ඔවුන් ද නෙරපීම සඳහා ආයාචනය කරමි.

අත්සන
සාමාන්‍යාධිකාරී

ඉහත සඳහන් උපලේඛනය
(දිස්ත්‍රික්කය ද ඇතුළුව පිහිටීම ප්‍රකාශ කෙරෙමින් ගොඩනැගිල්ල පිළිබඳ විස්තරයක් මෙහි සඳහන් කරන්න)

අත්සන
සාමාන්‍යාධිකාරී

දිනය : – ..............................................

*අදාළ නොවේ නම් කපා හරින්න.

"ඇ" ආකෘතිය (69ඈ වගන්තිය)

දිවුරුම් පත්‍රය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී (නම සඳහන් කරන්න) ........................................................................ වන මම, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පනතේ 69 ඈ වගන්තිය මගින් නියමිත පරිදි, ගාම්භීරතා පූර්වකව, අවංකව සහ සත්‍යවාදීව ද දිවුරා ප්‍රකාශ කරමි/ප්‍රතිඥා දී ප්‍රකාශ කරමි : –

(i) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සාමාන්‍යාධිකාරී මම වෙමි ;

(ii) නෙරපීම සඳහා වූ ඉල්ලීමේ උපලේඛනයෙහි විස්තර කර ඇති ගොඩනැගිල්ල හෝ එහි කොටස ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් ගොඩනැගිල්ලකි. නැතහොත්, ගොඩනැගිල්ලක කොටසක් ;

(iii) අස්කිරීමේ නිවේදනයක් (නෙරපීම සඳහා වූ ඉල්ලීමෙහි පිටපතක් අමුණා ඇත.) ..............................................(නම සහ ලිපිනය සඳහන් කරන්න) වෙත භාර දී ඇත/ *එකී ගොඩනැගිල්ල තුළ හෝ මත ප්‍රදර්ශනය කරනු ලැබ ඇත ;

(iv) එකී .....................................................(නම සඳහන් කරන්න) එකී ගොඩනැගිල්ලේ හෝ එහි කොටසේ අනවසරයෙන් සන්තකය/*පදිංචිය ලබා ගෙන ඇති අතර, ඒ පනතේ 69ඈ වගන්තියේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම පැහැර හැර ඇත.

අත්සන සහ පදවි නාමය

.............................................................................වන දින වූ මෙදින (දිනය සඳහන් කරන්න) සිද්ධි ප්‍රකාශක විසින් මා ඉදිරියේ දී දිවුරුම් දෙන ලදී/ප්‍රතිඥා දෙන ලදී.

දිවුරුම්/ප්‍රතිඥාව කරවන ලද තැනැත්තාගේ අත්සන සහ ඔහුගේ එසේ පදවියක් දරුවොත් පදවි නාමය.''

*අදාළ නොවේ නම්, කපා හරින්න.

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 1999 අංක 34 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (සංශෝධන) පනත

[ සහතිකය සටහන් කළේ 1999 ඔක්තෝබර් මස 07 වන දින.]

**1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ : –

1. මේ පනත 1999 අංක 34 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 2 දරන ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව පනතේ 6 වන වගන්තිය ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ : –

"(ආආ) (i) පදිංචිය සඳහා වූ නිවසක් තැනීමට ඉඩමක් මිලදී ගැනීම හෝ බද්දට ගැනීම සඳහා ;

(ii) පදිංචිය සඳහා වූ නිවසක් තැනීම, අලුත්වැඩියා කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම හෝ කොටසක් එකතු කිරීම සඳහා

(iii) පදිංචිය සඳහා වූ නිවසක් මිල දී ගැනීම හෝ බද්දට ගැනීම සඳහා

(iv) (i) වන, (ii) වන හෝ (iii) වන අනුඡේදවල සඳහන් කාර්යවලට ආනුෂංගික, අතිරේක හෝ අනුයාත වන ඕනෑම කාර්යයක් සඳහා ; හෝ

(v) (i) වන, (ii) වන හෝ (iii) වන හෝ (iv) වන අනුඡේදවල සඳහන් යම් කාර්යයක් සඳහා දැනටමත් දරා ඇති ණයක් බේරුම් කිරීම සඳහා

යම් තැනැත්තකුට ණය සහ අත්තිකාරම් ලබාදීම.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය, එහි 1 වන උපවගන්තිය ඉවත් කොට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ : –

"(1) මේ පනත යටතේ ස්වකීය වගකීම් ඉටු කිරීමේ කාර්යය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය අවුරුද්දකට යටත් පිරිසෙයින් දහවරක්වත් හා කාර්තුවකට දෙවතාවක්වත් රැස්විය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය, එහි 3 වන උපවගන්තිය ඉවත් කොට පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ : –

"(3) බැංකුවේ මුද්‍රාව සාමාන්‍යාධිකාරීවරයා හෝ වැඩ බලන සාමාන්‍යාධිකාරීවරයා හෝ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීවරයා හෝ සහකාර සාමාන්‍යාධිකාරීවරයා හා එක් අධ්‍යක්ෂවරයකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර තමන් සිටි බවට ලකුණක් වශයෙන් ඒ දෙදෙනාම ඒ සාධන පත්‍රයට අත්සන් තැබිය යුතු ය.".

5. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 1999 අංක 41 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[ සහතිකය සටහන් කළේ 1999 නොවැම්බර් මස 30 වන දින]

**1979 අංක 28 දරන දේශීය ආදායම් පනත
සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ : –

1. මේ පනත 1999 අංක 41 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1998 අංක 52 දරන පනතින් අවසන් වරට සංශෝධිත (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතේ 8 වන වගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ : –

(1) ඒ ඡේදයේ (Lxxv) අනුඡේදයේ "1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත යටතේ පිහිටුවන ලද භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය" යන වචන හා ඉලක්කම් වෙනුවට "1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත යටතේ පිහිටුවන ලද භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශය;" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ ඡේදයේ අගට පහත දැක්වෙන අනුඡේද එකතු කිරීමෙන් : –

"(Lxxvi) පොදු රාජ්‍ය මණ්ඩලීය සංවර්ධන සංස්ථාව;

(Lxxvii) 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කර ඇති ඉන්දියා ශ්‍රී ලංකා පදනම".

3. 1998 අංක 52 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඊ) ඡේදයේ (viii) වන අනුඡේදයේ "ශ්‍රී ලංකාවේ කාර්මික සහයෝගිතාව සලස්වනු ලබන එහි වැඩ සටහනක දී පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය විසින් " යන වචන වෙනුවට "ශ්‍රී ලංකාවේ කාර්මික සහයෝගිතාව සලස්වනු ලබන එහි වැඩ සටහනක දී පොදු රාජ්‍ය මණ්ඩලීය ලේකම් කාර්යාලය විසින් හෝ පොදු රාජ්‍ය මණ්ඩලීය සංවර්ධන සංස්ථාව විසින් ;" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.".

4. 1998 අංක 52 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ : –

(1) 1998 අංක 52 දරන පනතින් ඇතුළත් කරන ලද (xxii) සහ (xxiii) වන අනුඡේද (1) වන උපවගන්තියේ පිළිවෙලින් (xxiv) සහ (xxv) වන අනුඡේද ලෙස නැවත අංක යෙදීමෙන් ; සහ

(2) නැවත අංක යෙදූ (xxv) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුඡේද ඇතුළත් කිරීමෙන් : –

" (xxvi) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති යම් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් විසින් පළකරනු ලබන යම් නිල ලැයිස්තුවක ස්වකීය කොටස් 2000 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර නිල ලැයිස්තුගත කර ඇති සමාගමක් වන යම් සමාගමක කොටස් දරන යම් තැනැත්තකු විසින් 1999 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසු එහෙත් 2000 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව එකී කොටස් විකිණීමෙන් ;

(xxvii) ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර දී ඇති යම් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් විසින් පළ කරනු ලබන යම් නිල ලැයිස්තුවක අයිතිය වෙනස් වන අවස්ථාව වන විට නිල ලැයිස්තුගත කරනු ලැබ ඇත්තා වූ ද, යම් සමාගමක් විසින් නිකුත් කරනු ලැබුවා වූ ද –

(i) යම් කොටස් බලපත්‍රවල හෝ

(ii) වෙනත් යම් මූල්‍ය සාධන පත්‍රයකින් ව්‍යුත්පන්න වූ සහ ඒ මත රඳා පවත්නා වූ යම් මූල්‍ය සාධන පත්‍රයක,

අයිතිය වෙනස් වීම.".

5. 1998 අංක 52 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ : –

(1) ඒ වගන්තියේ (ත) ඡේදයේ "යම් ශ්‍රී ලාංකිකයකු වෙනුවෙනු 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී එකී කාර්යාංශය විසින් ගෙවන ලද මුදලක රුපියල් දෙදහසක් නොඉක්මවන කොටස" යන වචන හා ඉලක්කම් වෙනුවට "යම් ශ්‍රී ලාංකිකයකු වෙනුවෙන් –

(අ) 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1999 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී එකී කාර්යාංශය විසින් ගෙවන ලද මුදලක රුපියල් දෙදහසක් නොඉක්මවන කොටස ; සහ

(ආ) 1999 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී එකී කාර්යාංශය විසින් ගෙවන ලද මුදලක රුපියල් තුන්දහස නොඉක්මවන කොටස" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(2) ඒ වගන්තියේ (තත) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් : –

"(තත) 1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය පනතින් පිහිටුවන ලද ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සේවා නියුක්තිය සලසා දෙනු ලැබූ හෝ ලබා දෙනු ලැබූ යම් ශ්‍රී ලාංකිකයකු වෙනුවෙන්, .

(අ) 1990 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1999 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී එකී කාර්යාංශය විසින් ලබාගත් මුදලේ රුපියල් දෙදහසක් නොඉක්මවන කොටස; සහ

(ආ) 1999 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක දී එකී කාර්යාංශය විසින් ලබාගත් මුදලේ රුපියල් තුන්දහසක් නොඉක්මවන කොටස;".

6. 1998 අංක 52 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ : –

(i) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ –

(අ) ඒ උපවගන්තියේ (ඉඉ) ඡේදයේ –

(i) ඒ ඡේදයේ (iඅ) අනුඡේදයෙහි දක්වෙන "[(ii) වන හෝ (iiඅ) අනුඡේදයෙහි සඳහන් පිරියතක්, යන්ත්‍ර හෝ සවිකිරීම් නොවන]" යන වචන හා ඉලක්කම් වෙනුවට" [(ii), (iiඅ) හෝ (iiආ) අනුඡේදවල සඳහන් පිරියතක්, යන්ත්‍ර හෝ සවිකිරීම් නොවන]" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ; සහ

(ii) ඒ ඡේදයේ (iiඅ) අනුඡේදයට ඉක්බිතිව ම පහත දක්වෙන අනුඡේදය ඇතුළත් කිරීමෙන් : –

"(iiආ) 1998 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අත්කර ගත්තා වූ ද, ඒ තැනැත්තා විසින් කරගෙන යන්නා වූ හෝ පවත්වා ගෙන යන්නා වූ යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක භාවිත කරන්නා වූ ද යම් පරිගණක දෘඩාංග, විදුලි සංදේශ උපකරණ හෝ ඒවායේ යම් උපාංග ප්‍රතිස්ථාපනය කිරීම සඳහා හෝ නගා සිටුවීම සඳහා 1998 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2000 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ඔහු විසින් අත්කරගත් පරිගණක දෘඩාංග හෝ විදුලි සංදේශ උපකරණ හෝ ඒ පරිගණක දෘඩාංග හෝ ඒ උපකරණවල යම් උපාංග සහශ්‍ර වර්ෂ අනුකූලත්වයෙන් යුක්ත නම්, 1998 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව අත්කරගත් ඒ පරිගණක දෘඩාංග, විදුලි සංදේශ උපකරණ හෝ ඒ දෘඩාංගවල හෝ උපකරණවල උපාංග මත ඒවායේ අත්කර ගැනීමේ පිරිවැයෙන් සියයට සියයක අනුප්‍රමාණයක් අනුව දීමනාවක් ";

(ආ) ඒ උපවගන්තියේ (ඉඉඉඉ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

"(ඉඉඉඉ)(i) (ii) වන අනුඡේදයේ සඳහන් පරිගණක මෘදුකාංග නොවන,) ලාභ සහ ආදායම් නිශ්චය කරනු ලබන කාලසීමාව තුළ දී යම් තැනැත්තකු විසින් අත්කර ගනු ලැබුවා වූ ද ඔහු විසින් කරගෙන යනු ලබන හෝ පවත්වා ගෙන යනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක දී ඒ තැනැත්තා විසින් භාවිත කරන්නා වූ ද, යම් පරිගණක මෘදුකාංග සම්බන්ධයෙන් –

(අ) ඒ පරිගණක මෘදුකාංග එසේ අත්කර ගන්නා ලද්දේ 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වන අවස්ථාවක, ඒ පරිගණක මෘදුකාංග අත්කර ගැනීමේ පිරිවැයෙන් සියයට තිස් තුනයි තුනෙන් එකක් වන්නා වූ ද ; සහ

(ආ) ඒ පරිගණක මෘදුකාංග එසේ අත්කර ගන්නා ලද්දේ 1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව වන අවස්ථාවක, ඒ පරිගණක මෘදුකාංග අත්කර ගැනීමේ පිරිවැයෙන් සියයට පනහක් වන්නා වූ ද,

දීමනාවක් ;

(ii) 1998 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අත්කරගත්තා වූ ද ඒ තැනැත්තා විසින් කරගෙන යන්නා වූ හෝ පවත්වා ගෙන යන්නා වූ යම් වෙළෙඳමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්‍ෂාවක දී භාවිත කරන්නා වූ ද යම් පරිගණක මෘදුකාංග ප්‍රතිස්ථාපනය කිරීම සඳහා හෝ නගා සිටුවීම සඳහා 1998 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 2000 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ඔහු විසින් අත්කරගත් යම් පරිගණක මෘදුකාංග සහශ්‍ර වර්ෂ අනුකූලත්වයෙන් යුක්ත නම්, 1998 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව අත්කරගත් ඒ පරිගණක මෘදුකාංග සම්බන්ධයෙන් ඒවායේ අත්කර ගැනීමේ පිරිවැයෙන් සියයට සියයක අනුප්‍රමාණයක් වන දීමනාවක් ;

එසේ වුවද, පෙරාතුව ම වූ තක්සේරු වර්ෂවල දී පරිගණක මෘදුකාංග සම්බන්ධයෙන් ප්‍රදානය කරන ලද දීමනාවල එකතුව ඒ පරිගණක මෘදුකාංග අත්කර ගැනීමේ පිරිවැයට සමාන නම්, යම් තැනැත්තකුට පරිගණක මෘදුකාංග වෙනුවෙන් මේ ඡේදයේ පූර්වයෙන් වූ විධිවිධාන යටතේ කිසිදු අඩු කිරීමකට ඉඩ නොදිය යුතු ය.".

7. 1998 අංක 52 දරන පනතින් අවසන්වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියේ (2) වන උපවගන්තිය මෙයින් තවදුරටත් පහත දක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ : –

(1) ඒ උපවගන්තියේ තුන්වන අතුරු විධානයේ "1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව" යන වචන හා ඉලක්කම් වෙනුවට "1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්";

(2) ඒ උපවගන්තියේ හතරවන අතුරු විධානයේ "1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සහ 1997 මාර්තු මස 31 වන දින සිට 1997 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ කාලය" යන වචන හා ඉලක්කම් වෙනුවට "1989 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන එහෙත් 1997 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව වූ යම් තක්සේරු වර්ෂයක් සහ 1997 අප්‍රේල් මස 1 වන දින සිට 1997 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ කාල පරිච්ඡේදය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්.

8. 1998 අංක 52 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ (6) වන උපවගන්තිය මෙයින් තවදුරටත් පහත දක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ : –

(1) ඒ උපවගන්තියේ (i) වන ඡේදයේ "(2) වන උපවගන්තියේ (ආ), (ඇ), (ක) හෝ (ග) ඡේදවල" යන වචන සහ අකුරු වෙනුවට "(2) වන උපවගන්තියේ (ආ), (ඇ), (ක), (ග) හෝ (ණ) ඡේදවල" යන වචන සහ අකුරු ආදේශ කිරීමෙන් ;

(2) ඒ උපවගන්තියේ (ii) වන ඡේදයේ "(ට) හෝ (ණ) ඡේදයේ "යන වචන සහ අකුරු වෙනුවට "(ට) ඡේදයේ" යන වචන හා අකුරු ආදේශ කිරීමෙන් .".

9. 1998 අංක 52 දරන පනත මගින් ඇතුළත් කරන ලද ප්‍රධාන ප්‍රඥප්තියේ 32 ඇඇඇ වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ : –

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "1998 අප්‍රේල් මස 1 වන දිනයෙන්" යන වචන සහ ඉලක්කම්වල සිට "පහත දක්වෙන ලෙස ගණනය කළ යුතු ය" යන වචන දක්වා වූ කොටස වෙනුවට පහත දක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් : –

"(සමාගමක් නොවන) යම් තැනැත්තකුගේ බදු අය කළ හැකි ආදායමට –

(අ) 1998 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා (3 (අ) වන වගන්තියේ අර්ථානුකූලව) යම් කෘෂිකාර්මික ව්‍යවසායකින් හෝ සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සඳහා වූ යම් ව්‍යවසායකින් ; හෝ

(ආ) 1999 අප්‍රේල් මස 1 වන දිනයෙන් හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, (3(අ) වන වගන්තියේ අර්ථානුකූලව) යම් කෘෂිකාර්මික ව්‍යවසායකින්, සංචාරක ව්‍යාපාරය ප්‍රවර්ධනය සඳහා වූ යම් ව්‍යවසායකින් හෝ ඉදිකිරීම් වැඩ සඳහා වූ යම් ව්‍යවසායකින්,

ලැබෙන (මෙහි මින් මතු මේ වගන්තියේ "නිශ්චිත ලාභ" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් ලාභ සහ ආදායම් ඇතුළත් වන්නේ නම්, එකී ලාභ සහ ආදායම්වල (මෙහි මින් මතු මේ වගන්තියේ "ආදායමේ අදළ කොටස" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් කොටසක් මත ගෙවිය යුතු ආදායම් බදු අනු ප්‍රමාණය සියයට පහළොව ඉක්මවන අවස්ථාවක, ආදායමේ අදළ කොටස සම්බන්ධයෙන් ගෙවිය යුතු ආදායම් බද්ද පහත දක්වෙන ලෙස ගණනය කළ යුතු ය : –" ;

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ –

(i) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ අතුරු විධානයේ "ඒ විකිණීමක් යයි සලකනු ලබන විකිණීමෙන් උද්ගත වන ලාභය විය යුතු ය." යන වචන වෙනුවට " ඒ විකිණීමක් යයි සලකනු ලබන විකිණීමෙන් උද්ගත වන ලාභය විය යුතු ය" ; යන වචන ආදේශ කිරීමෙන් ;

(ii) ඒ වගන්තියේ (ඇ) වන ඡේදයට ඉක්බිතිව ම පහත දක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් : –

"(ඈ) "ඉදිකිරීම් වැඩ සඳහා වන ව්‍යවසාය" යන්නෙන්, වාසික තැනැත්තකු විසින් පවත්වා ගෙන යනු ලබන යම් –

(i) ගොඩනැගිලි ;

(ii) පාරවල් හෝ පාලම් ; හෝ

(iii) ජල සම්පාදන, ජලාපවාහන හෝ කසල ඉවත්කිරීමේ පද්ධති,

ඉදිකිරීම සඳහා වන ව්‍යවසායක් අදහස් වේ.".

10. 1998 අංක 52 දරන පනත මගින් ප්‍රධාන ප්‍රඥප්තියට ඇතුළත් කරන ලද 32 ඇඇඇඇ වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ : –

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් : –

"(1) යම් සමාගමක බදු අයකළ හැකි ආදායමට –

(අ) 1998 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා (3(අ) වන වගන්තියේ අර්ථානුකූලව) යම් කෘෂිකාර්මික ව්‍යවසායකින් හෝ සංචාරක ව්‍යාපාරයක් ප්‍රවර්ධනය කිරීම සඳහා වූ යම් ව්‍යවසායකින් ලැබෙන ලාභ හා ආදායම ඇතුළත් වන අවස්ථාවක ;

(ආ) 1999 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා (3 (අ) වන වගන්තියේ අර්ථානුකූලව) යම් කෘෂිකාර්මික ව්‍යවසායකින් හෝ සංචාරක ව්‍යාපාරයක් ප්‍රවර්ධනය කිරීම සඳහා වූ යම් ව්‍යවසායකින් හෝ ඉදිකිරීම් වැඩ සඳහා වූ යම් ව්‍යවසායකින් ලැබෙන ලාභ හා ආදායම ඇතුළත් වන අවස්ථාවක, ඒ බදු අය කළ හැකි ආදායමෙහි ඒ ලාභ හා ආදායම සංයුක්ත වන කොටස සඳහා, මේ පරිච්ඡේදයේ, VIII අ පරිච්ඡේදයේ හෝ IX වන පරිච්ඡේදයේ යම් විධිවිධානයක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද, සියයට පහළොවක අනුප්‍රමාණය අනුව ආදායම් බදු අය කළ යුතු ය.";

(2) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "යම් කෘෂිකාර්මික ව්‍යවසායක ලාභ සහ ආදායම" යන වචන වෙනුවට "යම් කෘෂිකාර්මික ව්‍යවසායක ලාභ සහ ආදායම සහ ඉදිකිරීම් වැඩ සඳහා වන ව්‍යවසාය" යන වචන ආදේශ කිරීමෙන් .".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 32 ඉඉඉඉ වගන්තියේ, (3) වන උපවගන්තියේ "1997 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා එකී කොටසෙන් සියයට දෙකහමාරකට සමාන ලෙස ඒ සමාගමට අදළ විය යුතු ය," යන වචන හා ඉලක්කම් වෙනුවට"1997 අප්‍රේල් මස 1 වන දින ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා ඒ සමාගමට අදළ විය යුතු ය." යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 32ඉඉඉඉඉ වගන්තියේ (3) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "තුන් සියයකට අඩු නොවන බවට" යන වචනවල සිට ඒ ඡේදයේ අවසානය දක්වා ඇති වචන වෙනුවට පහත දක්වෙන වචන ආදේශ කිරීමෙන් ඒ

වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ : –

"තුන් සියයකට අඩු නොවන බවට,

තක්සේරුකරු සෑහීමකට පත් වන්නේ නම්, (1) වන උපවගන්තියේ සඳහන් අඩු කිරීම, 1997 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා එකී කොටසින් සියයට දෙකහමාරකට සමාන ලෙස, ඒ සමාගමට අදාළ විය යුතු ය".

13. 1997 අංක 24 දරන පනතින් අවසන් වරට සංශෝධිත, ප්‍රධාන ප්‍රඥප්තියේ 113අ වගන්තිය එහි (1) වන උපවගන්තියේ "පොලිය" යන අර්ථකථනයේ (ආ) ඡේදයේ, (ii) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය ඇතුළත් කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ : –

"(iii) ශ්‍රී ලංකා සුරැකුම් පත් සහ විනිමය කොමිෂන් සභාව විසින් බලපත්‍ර නිකුත් කරන ලද යම් ව්‍යාපාර වස්තු විනිමය ස්ථානයක් විසින් පළ කරනු ලබන යම් තිල ලැයිස්තුවක, තිල ලැයිස්තුගත කර ඇත්තා වූ ද, යම් තැනැත්තකු විසින් දරන්නා වූ ද, බැඳුම්කර, නෝට්ටු, ණයකර, ණය, ස්කන්ධ හෝ වෙනත් සුරැකුම්පත් මත.".

14. 1997 අංක 24 දරන පනතින් අවසන් වරට සංශෝධිත ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ IV වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ : –

(අ) ඒ කොටසේ (ඇ) ඡේදයේ "1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා –" යන වචන හා ඉලක්කම් වෙනුවට, "1997 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව එහෙත් 1999 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා –" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන් ;

(ආ) ඒ කොටසේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් : –

"(ඈ) 1999 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා –

| | | |
|---|---|---|
| පළමුවන | රු. 500,000 මත | කිසිවක් නැත |
| ඊළඟ | රු. 150,000 මත | සියයට 5 |
| ඊළඟ | රු. 150,000 මත | සියයට 10 |
| ශේෂය | මත | සියයට 15.". |

15. (1) මේ පනතේ පිළිවෙලින් 4 වන, 5 වන, 9 වන, 10 වන, 13 වන සහ 14 වන වගන්ති වලින් ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය, 15 වන වගන්තිය, 32ඇඇඇ වගන්තිය, 32ඇඇඇඇ වගන්තිය, 113අ වගන්තිය සහ පළමුවන උපලේඛනයට කරන ලද සංශෝධන සියලු කාර්ය සඳහා, 1999 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) මේ පනතේ 6 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තියට කරන ලද සංශෝධනය සියලු කාර්ය සඳහා 1998 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතුය.

(3) මේ පනතේ 7 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තියට කරන ලද සංශෝධනය සියලු කාර්ය සඳහා 1998 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) මේ පනතේ 8 වන වගන්තියෙන් ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියට කරන ලද සංශෝධනය සියලු කාර්ය සඳහා 1997 නොවැම්බර් මස 6 වන දින සිට බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) 1998 අංක 52 දරන පනතේ 2 (1) (ඇ) වගන්තියෙන්, 1992 අංක 33 දරන පතල් හා ඛනිජ පනත යටතේ පිහිටුවන ලද භූ විද්‍යා සමීක්ෂණ සහ පතල් කාර්යාංශයට අදාළව ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියට කරන ලද සංශෝධනය, එකී පනතේ ඊට පටහැනිව කුමක් සඳහන් වුවද, සියලු කාර්ය සඳහා, 1993 මාර්තු මස 18 වන දින බලාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

16. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

# 1999 අංක 49 දරන විසර්ජන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1999 දෙසැම්බර් මස 10 වන දින]

**1998 අංක 61 දරන විසර්ජන පනත**
**සංශෝධනය කිරීම සඳහා වූ පනතකි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

1. මේ පනත 1999 අංක 49 දරන විසර්ජන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 1998 අංක 61 දරන විසර්ජන පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙහි "මුදල්වල සමස්තය රුපියල් නව දහස් හත්සිය දෙකෝටි හැත්තෑ ලක්ෂයක් නොඉක්මවන" යන වචන වෙනුවට "මුදල්වල සමස්තය රුපියල් එකොළොස් දහස් හත්සිය දෙකෝටි හැත්තෑ ලක්ෂයක් නොඉක්මවන" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

3. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.